# 4 වැනි පරිච්ඡේදය

# මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාවය

## 4.1 සමස්ත නිරීක්ෂණ

**2008 වසරේ අවසන් කාලයේ දී දක්නට ලැබුණු උද්ධමනයේ පහත වැටීම, ඉල්ලුම් සහ සැපයුම් යන දෙ අංශයේම සාධකවල හිතකර වර්ධනයන් හේතුවෙන්, 2009 වසරේ දී තවදුරටත් අඛණ්ඩව සිදු විය.** කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2002=100) මගින් මනිනු ලබන උද්ධමන අනුපාතිකය, ලක්ෂ්‍යමය පදනම මත 2008 ජුනි මාසයේ දී වාර්තා කළ එහි උච්චතම මට්ටම වූ සියයට 28.2 සිට 2009 දෙසැම්බර් මාසයේ දී සියයට 4.8 දක්වා පහත වැටිණි. පෙර වසර දෙක තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තියේ බලපෑමත්, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් පහත වැටීම මෙන්ම වර්ධනය වූ දේශීය සැපයුම් තත්ත්වයත්, පරිපාලිත මිල ගණන් අඩු වන පරිදි සංශෝධනය කිරීමත් උද්ධමනය ශීඝ්‍ර ලෙස අඩු වීමට උපකාරී විය. රජයේ හා පෞද්ගලික යන අංශවල සේවකයන්ගේ වැටුප් වැඩි වීමෙන් උද්ධමනය කෙරෙහි ඇති වූ පීඩනය සැපයුම් සාධකවල හිතකර වර්ධනයත්, ඉහළ ශ්‍රම ඵලදායිතාවය මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව අනුගමනය කරන ලද විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්තියත් හේතු කොට ගෙන මැඩපැවැත්විණි. ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය 2009 සැප්තැම්බර් මාසයේ පැවැති සියයට 0.7 සිට දෙසැම්බර් මාසයේ දී සියයට 4.8 දක්වා, ක්‍රමිකව වැඩි වූ අතර, එය ප්‍රධාන වශයෙන්ම 2008 වර්ෂයේ අදාල කාලපරිච්ඡේදයේ දී දර්ශකයෙහි අගය පහළ මට්ටමක පැවතීමේ ප්‍රතිඵලයකි. මේ අතර, වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය 2008 ඔක්තෝබර් මාසයේ දී පැවැති එහි ඉහළම අගය වූ සියයට 23.4 සිට අඛණ්ඩව අඩු වෙමින් 2009 අගෝස්තු මාසයේ දී සියයට 8.5 දක්වා වූ තනි ඉලක්කමක මට්ටමට ළඟා වී, තවදුරටත් සැලකිය යුතු ලෙස අඩු වෙමින් 2009 දෙසැම්බර් මාසයේ දී සියයට 3.4 දක්වා පහත වැටිණි. මෙය 1985 වර්ෂයෙන් පසුව වාර්තා වූ අඩුම වාර්ෂික සාමාන්‍ය (වර්ෂ අවසාන) උද්ධමන අනුපාතිකය විය. මේ අතර, කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙහි ආහාර සහ බලශක්ති නොවන අයිතමයන් හි මිල විචලනය මනිනු ලබන මූලික උද්ධමනය ද, 2009 වසර මුළුල්ලේම පහළ බැසීමේ නැඹුරුවක් අනුගමනය කරමින් ලක්ෂ්‍යමය පදනම මත 2008 දෙසැම්බර් මස පැවති සියයට 15.7 හි සිට 2009 දෙසැම්බර් මාසයේ දී සියයට 5.9 දක්වා ළඟා විය. එමෙන්ම වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද 2008 දෙසැම්බර් මස පැවති සියයට 13.6 සමග සසඳන විට 2009 දෙසැම්බර් මාසයේ දී සියයට 9.2 දක්වා පහළ වැටිණි.

**පසුගිය වසරට සාපේක්ෂව 2009 වසරේ දී රාජ්‍ය අංශය, විධිමත් පෞද්ගලික අංශය සහ අවිධිමත් පෞද්ගලික අංශය යන තෙඅංශයෙහිම නාමික සහ මූර්ත යන දෙයාකාරයේම වැටුප් ඉහළ ගියේය.** 2009 වසරේ ජනවාරි සහ නොවැම්බර් මාසවල දී ජීවන වියදම් දීමනාව පිළිවෙළින් රුපියල් 1,000කින් සහ රුපියල් 750කින් වැඩි වන පරිදි ගැලපීමත් සමඟ රාජ්‍ය අංශයේ සියලුම කාණ්ඩවල සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයන් 2009 වසරේ දී සියයට 9.4කින් පමණ ඉහළ නැගිණි. වසර මුළුල්ලේම උද්ධමනය පහළ වැටීම

හේතු කොට ගෙන, 2008 වසරේ දී මූර්ත වැටුප්වල සිදු වූ අඩු වීම හා සසඳන විට 2009 වසරේ දී සියයට 5.7ක පමණ මූර්ත වැටුප් වැඩි වීමක් භුක්ති විඳීමට රාජ්‍ය අංශයේ සේවකයන්ට හැකි විය. මෙලෙසම, පඩි පාලක සභා මගින් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයෙහි ප්‍රධාන කාණ්ඩ තුන සඳහා වන අවම වැටුප්, මෙම අංශය සඳහා වන සමස්ත නාමික වැටුප් අනුපාත දර්ශකය සියයට 4.9කින් ඉහළ නංවමින් වැඩි විය. උද්ධමනය ක්‍රමිකව පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ දී ඔවුන්ට මූර්ත වැටුප්වල සාමාන්‍යයෙහි සියයට 1.6ක ඉහළ යෑමක් භුක්ති විඳිය හැකි විය. එම උපනතියම අනුව යමින් අවිධිමත් අංශයේ නාමික මෙන්ම මූර්ත වැටුප් ද 2009 වසරේ දී ඉහළ ගියේය.

**පසුගිය වසර කිහිපය තුළ දී අඩු වෙමින් පැවැති සේවාවියුක්ති අනුපාතය, 2008 වසර තුළ දී අවම මට්ටම වාර්තා කළ අතර, ගෝලීය ආර්ථික අවපාතය හේතුවෙන් ආර්ථිකයේ අංශ කිහිපයක් මත ඇති කළ අහිතකර බලපෑම් හේතු කොට ගෙන එහි නැවත වැඩිවීමක් දක්නට ලැබිණි.** කෙසේ නමුත්, ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ දැනට ක්‍රියාත්මක කෙරෙන ආර්ථික ක්‍රියාදාමයන් හේතුවෙන් ලැබූ ආර්ථික පුනර්ජීවනයත් සමඟ, 2009 වසරේ තෙවන කාර්තුවෙහි සිට සේවාවියුක්ති අනුපාතය පහත වැටීම ආරම්භ කෙරුණි. මේ අතර සමස්ත සේවා නියුක්තියෙහි, සේවා අංශයෙහි ප්‍රමුඛත්වය තවදුරටත් වර්ධනය කරමින් සහ කර්මාන්ත අංශයෙහි පංගුව අඩු කරමින් ප්‍රධාන කර්මාන්ත කාණ්ඩ අතර සේවානියුක්ති සංයුතියෙහි වෙනස්කම් දක්නට ලැබුණි. වර්ෂය තුළ දී රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සහ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන්ගේ සේවානියුක්තිය වර්ධනය වී ඇත. කෙසේ වුව ද, ස්වයං රැකියාවන්හි නියුතු කාණ්ඩයේ සහ සේවායෝජක කාණ්ඩයේ පහත වැටීමක් නිරීක්ෂණය විය. දැනට ක්‍රියාත්මක කෙරෙන සහ සැලසුම් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන යෝජනා ක්‍රම මගින් වැඩි රැකියා අවස්ථාවන් ජනනය කිරීමට හැකිවනු ඇත. විශේෂයෙන්ම, උතුරු සහ නැගෙනහිර පළාත්වල කෘෂිකාර්මික අංශයෙහි ක්‍රියාකාරකම්වල වර්ධනය මගින් ද වැඩි සේවානියුක්ති අවස්ථා උත්පාදනය කරනු ඇත. මේ අතර, මෑත වර්ෂ කිහිපය තුළ දක්නට ලැබුණු ශ්‍රම ඵලදායිතාවයේ ඉහළ යෑම තවදුරටත් සිදු විය. එමෙන්ම, මුළු දේශීය සේවා නියුක්ති ජනගහනයෙන් හතරෙන් පංගුවක් වූ විදේශ සේවා නියුක්තිය, ආර්ථිකයෙහි විදේශ විනිමය ඉපැයීම් සඳහා සැලකිය යුතු ආයකත්වයක් සැපයීය.

## 4.2 මිල


### මිල විචලනයන් සහ දායක වූ සාධක

#### කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.)

**ශ්‍රී ලංකාවේ නිල පාරිභෝගික මිල දර්ශකය වන කො.පා.මි. දර්ශකය ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.8ක ඉහළ නැගීමක් ද වාර්ෂික සාමාන්‍ය පදනම මත සියයට 3.4ක ඉහළ නැගීමක් ද වාර්තා කළේය.** මෙය දශක දෙකකට වැඩි කාලපරිච්ඡේදයක් තුළ වාර්තා වූ පහළම වර්ෂාවසාන වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය විය. 2008 දෙසැම්බර් මස 203.7ක්ව පැවැති දර්ශකය 2009 දෙසැම්බර් මාසයේ දී 213.5 දක්වා දර්ශකාංක 9.8කින් ඉහළ නැගිණි. දර්ශකයේ ලක්ෂ්‍යමය වර්ධනය 2009 ජනවාරි මාසයේ පැවැති සියයට 10.7හි සිට තියුණු ලෙස අඩු වෙමින් සැප්තැම්බර් මාසයේ දී වර්ෂ පහකට අධික කාලයක් තුළ වාර්තා වූ පහළම උද්ධමන අගය වන සියයට 0.7 දක්වා ළඟා විය. අනතුරුව, එය 2009 දෙසැම්බර් මාසයේ දී සියයට 4.8 දක්වා ක්‍රමිකව වැඩි විය. වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය 2008 ඔක්තෝබර් මස පැවැති එහි ඉහළම මට්ටම වූ සියයට 23.4 හි සිට නොකඩවා අඩු විය.

**2009 වසරෙහි උද්ධමනය පහළ යෑම ඉල්ලුම් හා සැපයුම් යන දෙ අංශයෙහිම සාධක හේතුවෙන් සිදු වූවකි.** ඉල්ලුම් අංශයෙන් ගත් විට, පසුගිය වසර දෙක තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ආර්ථිකය තුළ ඉල්ලුම් පීඩනය පාලනය කිරීමට උපකාරී විය. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවක වැටුප් ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස පැන නැගිය හැකිව තිබූ යම්කිසි ඉල්ලුම් පීඩනයක් පාලනය කිරීමට සැපයුම් අංශයේ සිදු වූ හිතකර වර්ධනයන්, ඉහළ ඵලදායිතාවය මෙන්ම දූරදර්ශී මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඉවහල් විය. උතුරු හා නැගෙනහිර පළාත් ප්‍රධාන

**4.1 රූප සටහන** **කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (2002 = 100)**



**4.1 සංඛ්‍යා සටහන**

**මිල දර්ශකවල වෙනස්වීම්**

| දර්ශකය | දර්ශකයේ සාමාන්‍යය | | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 (අ) | 2008 දෙසැ. /2007 දෙසැ. | 2009 දෙසැ. /2008 දෙසැ. (අ) | 2008/2007 | 2009/2008 (අ) |
| කො.පා.මි.ද. (2002=100) | 163.1 | 199.9 | 206.8 | 14.4 | 4.8 | 22.6 | 3.4 |
| තොග මිල දර්ශකය | 2,924.4 | 3,653.6 | 3,500.9 | 0.7 | 13.3 | 24.9 | -4.2 |
| ද.දේ.නි. අවධමනකය | 256.4(ආ) | 298.3 | 315.1 | - | - | 16.3 | 5.7 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කොට දේශීය සැපයුම් තත්ත්වයන් වර්ධනය වීම සහ විනිමය අනුපාතයෙහි ස්ථායිතාවය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල පහළ යෑම වසර තුළ කො.පා.මි. දර්ශකය මත මිල පීඩනය අඩු කළේය.

**2009 වසරේ මුළු මාසික පරිභෝජන වියදමෙන් සාමාන්‍ය වශයෙන් සියයට 72.6ක් සඳහා දායක වූ දේශීයව නිෂ්පාදිත භාණ්ඩවල මිල ඉහළ යෑම වර්ෂය තුළ උද්ධමනය කෙරෙහි විශාල ලෙස බලපෑවේය.** ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි දේශීයව නිෂ්පාදිත භාණ්ඩවල දායකත්වය 2009 ජනවාරි මස පැවැති සියයට 75.4හි සිට 2009 දෙසැම්බර් මාසයේ දී සියයට 100.6 දක්වා ඉහළ නැගුණු අතර, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ශීඝ්‍ර ලෙස පහළ යෑමට සමගාමීව, ආනයනික භාණ්ඩවල ඒ සඳහා වූ දායකත්වය 2009 ජනවාරි මස පැවැති සියයට 24.6හි සිට 2009 දෙසැම්බර් මාසයේ දී සියයට -0.6 දක්වා පහත වැටිණි.

**කො.පා.මි. දර්ශකයේ ඉහළම බර තැබීම වන සියයට 46.7ක් දරන ආහාර සහ මධ්‍යසාර නොවන පාන අයත් උප දර්ශකය උද්ධමනය සඳහා ප්‍රධාන දායකත්වය සැපයීය.** ආහාර උප දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස වර්ෂය ආරම්භයේ දී පැවැති සියයට 10.2 හි සිට 2009 අප්‍රේල් මාසයේ දී සියයට -1.1 දක්වා ශීඝ්‍ර ලෙස අඩු වී ඉන්පසුව 2009 දෙසැම්බර් මාසයේ දී සියයට 6.0 දක්වා ඉහළ නැගිණි. සමස්ත දර්ශකය තුළ ආහාර උප දර්ශකයට හිමි ප්‍රමුඛතාවය හේතුවෙන් සමස්ත උද්ධමනය බොහෝ දුරට ආහාර උප දර්ශකයට සමගාමීව විචලනය විය. වර්ෂය තුළ සමස්ත කො.පා.මි. දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වෙනස කෙරෙහි ආහාර උප දර්ශකය සියයට 40.1කින් දායක විය. 2009 වසර අවසානයේ දී ආහාර උප දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය ඉහළ යාම සියයට 2.8ක් විය. මාළු, දෙහි, සුදු ළූණු, ලොකු ළූණු හා රතු ළූණු, සීනි, පරිප්පු, අර්තාපල් සහ බිත්තරවල මිල වැඩි වීම ආහාර උප දර්ශකයෙහි ඉහළ යෑමට දායක වූ ප්‍රධාන අයිතමයන් විය.

**දේශීය සැපයුම් තත්ත්වයන්හි වර්ධනයන් හේතුවෙන් විශේෂයෙන්ම සහල්, ධාන්‍ය, එළවළු සහ පොල් වැනි සමහර දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනවල සාමාන්‍ය මිල පහළ යෑම මිල පීඩනය අඩු කිරීමට දායක විය.** යල අස්වැන්න කෙරෙහි බලපෑ අයහපත් දේශගුණික තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස සැපයුම් හිඟතාවයක් ඇති වීමෙන් වසර මැද දී හා වසර අග දී වී මිලෙහි ඉහළ යෑම් වාර්තා වුව ද, 2008 වසර සමඟ සැසඳීමේ දී සහල්වල සාමාන්‍ය මිල 2009 දී සියයට 2.1කින් අඩු විය. සහල් මිල අඩු වීම කෙරෙහි, 2008/2009 සතුටුදායක මහ අස්වැන්න, රජය මගින් සහල් මත උපරිම මිල සීමාවන් පැනවීම සහ වසර අග දී සහල් ආනයන තීරු බදුවලින් නිදහස් කිරීම ඉවහල් විය. වසරේ සමහර මාසවල දී මිල වැඩි වීම් වාර්තා වුව ද පෙර වර්ෂය සමඟ සැසඳීමේ දී එළවළු මිල ද සාපේක්ෂව පහළ මට්ටමක පැවැතිණි. ප්‍රධාන වශයෙන්ම, අර්තාපල් වගා කරනු ලබන ප්‍රදේශවල පැවැති අයහපත් කාලගුණික තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස සැපයුම අඩු වීම හේතුවෙන් අර්තාපල්වල දේශීය මිල පෙර වර්ෂයට සාපේක්ෂව 2009 දී සාමාන්‍ය වශයෙන් සියයට 19.5කින් ඉහළ ගියේය. 2008 සමඟ සැසඳීමේ දී 2009 දී පොල් සහ පොල් තෙල්වල සාමාන්‍ය මිල පිළිවෙළින් සියයට 22.2කින් සහ සියයට 24.0කින් පහත වැටිණි.

**ඉල්ලුම වැඩි වීම සහ සැපයුම් තත්ත්වයේ වෙනස් වීම් හේතුකොට ගෙන මත්ස්‍ය සහ මුහුදු ආහාරවල සාමාන්‍ය මිල 2009 වසර තුළ දී සියයට 4.4කින් පමණ ඉහළ ගියේය.** එසේ නමුත්, ජූලි මාසයේ දී මසුන් ඇල්ලීමේ වාරය ආරම්භ වීම හා උතුරු හා නැගෙනහිර මුහුදුබඩ ප්‍රදේශවල මසුන් ඇල්ලීම සඳහා පැවැති සීමාවන් ලිහිල් කිරීම හේතුවෙන් 2009 ජුනි මස සිට මත්ස්‍ය සැපයුම ඉහළ ගිය අතර, මත්ස්‍ය මිල ගණන්වල තරමක අඩු වීමක් දක්නට ලැබිණි.

**වසර තුළ දී සිදු වූ පාලන මිල සංශෝධන මගින් දේශීයව නිෂ්පාදිත හා ආනයනික භාණ්ඩ යන දෙවර්ගයෙහිම මිල ගණන් කෙරෙහි බලපෑමක් ඇති කෙරිණි.** 2008 දෙසැම්බර් මස අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි ඉන්ධන මිල අඩු කිරීම් (පෙට්‍රල්

**4.2 සංඛ්‍යා සටහන**

**ආනයනික සහ දේශීයව නිෂ්පාදිත ප්‍රධාන අයිතමයන්ගේ සිල්ලර මිල ගණන්**

| අයිතමය | ඒකකය | කො.පා.මි.ද. (2002=100) භරිත% | මිල රු. වාර්ෂික සාමාන්‍යය 2007 | මිල රු. වාර්ෂික සාමාන්‍යය 2008 | මිල රු. වාර්ෂික සාමාන්‍යය 2009(අ) | මිල රු. 2007 දෙසැ. | මිල රු. 2008 දෙසැ. | මිල රු. 2009 දෙසැ. (අ) | ප්‍රතිශත වෙනස වාර්ෂික සාමාන්‍යය 2008/2007 | ප්‍රතිශත වෙනස වාර්ෂික සාමාන්‍යය 2009/2008(අ) | ප්‍රතිශත වෙනස ලක්ෂ්‍යමය 2008දෙසැ./2007දෙසැ. | ප්‍රතිශත වෙනස ලක්ෂ්‍යමය 2009දෙසැ./2008දෙසැ.(අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දේශීය** | | | | | | | | | | | | |
| සම්බා සහල් | කි.ග්‍රෑ.1ක් | 2.8 | 50.98 | 76.53 | 76.57 | 63.71 | 78.64 | 82.41 | 50.1 | 0.1 | 23.4 | 4.8 |
| රතු කැකුළු සහල් | ,, | 0.9 | 44.56 | 64.65 | 63.64 | 55.32 | 66.38 | 66.78 | 45.1 | -1.6 | 20.0 | 0.6 |
| සුදු කැකුළු සහල් | ,, | 0.6 | 38.78 | 60.66 | 59.85 | 51.68 | 62.63 | 63.22 | 56.4 | -1.3 | 21.2 | 0.9 |
| නාඩු සහල් | ,, | 0.5 | 44.45 | 65.29 | 65.44 | 56.99 | 68.43 | 69.45 | 46.9 | 0.2 | 20.1 | 1.5 |
| පොල් (මධ්‍යම ප්‍රමාණය) | එකක් | 5.4 | 21.83 | 28.88 | 23.02 | 27.83 | 24.87 | 27.53 | 32.3 | -20.3 | -10.6 | 10.7 |
| මාළු (කෙළවල්ලා) | කි.ග්‍රෑ.1ක් | 1.1 | 407.10 | 471.50 | 510.18 | 414.72 | 490.07 | 502.60 | 15.8 | 8.2 | 18.2 | 2.6 |
| බෝංචි | ,, | 0.5 | 83.51 | 102.60 | 95.41 | 82.93 | 110.27 | 116.04 | 22.9 | -7.0 | 33.0 | 5.2 |
| වම්බටු | ,, | 0.2 | 52.12 | 64.57 | 60.03 | 55.99 | 81.49 | 82.53 | 23.9 | -7.0 | 45.5 | 1.3 |
| බිත්තර | එකක් | 0.4 | 9.31 | 10.16 | 11.44 | 11.64 | 11.55 | 14.53 | 9.1 | 12.6 | -0.8 | 25.8 |
| **ආනයනික** | | | | | | | | | | | | |
| සීනි | කි.ග්‍රෑ.1ක් | 1.1 | 54.30 | 63.58 | 82.09 | 53.21 | 66.12 | 88.12 | 17.1 | 29.1 | 24.3 | 33.3 |
| කිරිපිටි - ඇන්කර් | ග්‍රෑ.400 ක් | 3.8 | 189.32 | 274.63 | 254.30 | 268.82 | 267.32 | 232.77 | 45.1 | -7.4 | -0.6 | -12.9 |
| රතු පරිප්පු | කි.ග්‍රෑ.1ක් | 0.8 | 103.80 | 189.11 | 199.37 | 117.64 | 205.31 | 177.66 | 82.2 | 5.4 | 74.5 | -13.5 |
| තිරිඟු පිටි | ,, | 0.2 | 55.36 | 73.86 | 71.75 | 66.12 | 71.81 | 70.62 | 33.4 | -2.9 | 8.6 | -1.7 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් 10කින්, ඩීසල් රුපියල් 10කින් සහ භූමිතෙල් රුපියල් 2කින්) මිල ගණන් මත සෘජු හා වක්‍ර බලපෑම් ඇති කළේය. කෙසේ නමුත්, බොරතෙල් බැරලයක ආනයනික මිල 2009 ජනවාරි මස පැවැති එ.ජ. ඩොලර් 41.71 සිට 2009 ජුනි මාසයේ දී එ.ජ. ඩොලර් 72.8 දක්වා ඉහළ යෑමට අනුරූපව, 2009 ජූලි මස සිට බලපැවැත්වෙන පරිදි පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් ලීටරයක මිල පිළිවෙළින් රුපියල් 10, රුපියල් 3 සහ රුපියල් 1 ලෙස ඉහළ නංවමින් ගැලපීම් කිරීම නිසා වසරේ ඉතිරි කාලය තුළ දී මිල ගණන් ඉහළ යාමට සුළු පීඩනයක් ඇති විය. 2009 දෙසැම්බර් 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 15කින් පහළ දැමීමෙන් කො.පා.මි.ද. මත ඇති වන බලපෑම 2010 වසරේ දී දැනෙනු ඇත. මේ අතර, වර්ෂය තුළ දී එල්.පී. ගෑස් මිල හය වතාවක් සංශෝධනය කෙරිණි. 2008 දෙසැම්බර් 31 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කිලෝ ග්‍රෑම් 12.5ක ෂෙල් ගෑස් සිලින්ඩරයක සහ ලාෆ් ගෑස් සිලින්ඩරයක මිල පිළිවෙළින් රුපියල් 166කින් (සියයට 9.3) රුපියල් 1,619 දක්වා ද, රුපියල් 276කින් (සියයට 16.4) රුපියල් 1,403 දක්වා ද අඩු කරන ලදී. මෙම වර්ග දෙකෙහි, සය වතාවක දී සිදු වූ මිල සංශෝධනයන්හි ශුද්ධ බලපෑමේ ප්‍රතිඵලයක් වශයෙන් වසර අවසානය වනවිට ගෘහස්ථ ෂෙල් ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,550 දක්වා සියයට 4.3කින් අඩු වූ නමුත් ලාෆ් ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,421 දක්වා සියයට 1.3කින් වැඩි විය.

**ජාත්‍යන්තර භාණ්ඩ මිල අඩු වීමට අනුරූපව දේශීය ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ වර්ගවල මිල ද පහත වැටිණි.** වසර මුල දී නැව් ගාස්තු අඩු වීම ද මිල ගණන්වල පහත බැසීම කෙරෙහි දායක විය. ඒ අනුව, තිරිඟුපිටි, කිරිපිටි, පාම් තෙල් සහ එළවළු තෙල් යන ආනයනික භාණ්ඩවල සාමාන්‍ය මිල පහත වැටිණි. කෙසේ නමුත්, අඩු සැපයුම් තත්ත්වය නිසා ජාත්‍යන්තර වෙළඳපොළේ පරිප්පු සහ සීනි මිල ගණන් ඉහළ ගියේය. ඒවායේ දේශීය මිල ගණන් ස්ථායී කිරීම සඳහා 2009 අප්‍රේල් මස ආරම්භයේ සිට රජය විසින් මෙම භාණ්ඩ මත ඉහළ මිල සීමා පනවන ලදී. මෙම මිල සීමා 2009 මැයි මස 01 වැනි දින සිට ඉවත් කරන ලදී. එමෙන්ම, රජය විසින් ප්‍රධාන ආහාර ද්‍රව්‍ය කිහිපයක් සමූපකාර වෙළඳසැල් හරහා අඩු මිලට අලෙවි කිරීම සඳහා විධිවිධාන යොදන ලදී. ඒ අනුව, 2009 නොවැම්බර් මස 7 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සීනි, පරිප්පු සහ ටින් මාළු මිල අඩු කරන ලදී. තව ද, 2009 ජූලි 20 වැනි දින සහ දෙසැම්බර් 18 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කිරිපිටි සහ තිරිඟු පිටි මත පනවන ලද ආනයන බදු පිළිවෙළින් කිලෝ ග්‍රෑම් 1ක් සඳහා රුපියල් 15කින් සහ රුපියල් 10කින් අඩු කරන ලදී.

**නව බදු සහ අය කිරීම් ද මිල ගණන් මත බලපෑමක් ඇති කළේය.** 2009 ජනවාරි 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි දුරකථන ගාස්තු මත ස්ථාවර දුරකථන ග්‍රාහක බද්ද නමින් නව බද්දක් හඳුන්වා දීම සහ 2009 මාර්තු මස සිට බලපැවැත්වෙන

පරිදි සියයට 1ක ජාතිය ගොඩනැගීමේ බද්දක් හඳුන්වා දීම කො.පා.මි. දර්ශකය මත සෘජු බලපෑමක් ඇති කළේය. 2009 මැයි මාසයේ දී ජාතිය ගොඩ නැගීමේ බද්ද සියයට 3 දක්වා වැඩි කරන ලදී. 2009 පෙබරවාරි මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ජල ගාස්තු ඉහළ දැමීම ද මිල දර්ශකයේ ඉහළ යෑම කෙරෙහි දායක විය.

**මිල දර්ශකයේ ඉහළ යෑමට සෞඛ්‍ය, විනෝදාත්මක හා සංස්කෘතික සහ අධ්‍යාපන යන උප දර්ශකවලින් සැලකිය යුතු දායකත්වයක් ලැබුණි.** මිල දර්ශකය තුළ මෙම උප දර්ශකවල බර තැබීම සාපේක්ෂව අඩු වුව ද, 2009 වර්ෂයේ දී වාර්ෂික සාමාන්‍ය වැඩි වීම කෙරෙහි ලැබුණු දායකත්වය පිළිවෙළින් සියයට 19.3, සියයට 10.7 සහ සියයට 9.3ක් විය. පෞද්ගලික රෝහල් සේවය, ඖෂධ, විශේෂඥ උපදේශන ගාස්තු සහ වෛද්‍ය රසායනාගාර සේවා ගාස්තු ඉහළ යෑම සෞඛ්‍ය උප කාණ්ඩයේ ඉහළ යෑම සඳහා ප්‍රධාන ලෙස හේතු විය. හෝටල් ගාස්තු සහ පෞද්ගලික පංති ගාස්තු ඉහළ යෑම, විනෝදාත්මක හා සංස්කෘතික සහ අධ්‍යාපන යන උප දර්ශකවල ඉහළ යෑම සඳහා බලපෑමක් ඇති කළේය. මේ අතර, ප්‍රවාහන උප කාණ්ඩය වාර්ෂික සාමාන්‍ය උද්ධමනය කෙරෙහි සියයට 2.1ක සෘණ දායකත්වයක් වාර්තා කළේය. ඉන්ධන මිල ගණන් සහ පොදු ප්‍රවාහන ගාස්තු අඩු වන පරිදි සංශෝධනය කිරීම හේතු කොට ගෙන ප්‍රවාහන උප කාණ්ඩය උද්ධමනය කෙරෙහි සෘණ දායකත්වයක් සැපයීය. අනෙකුත් සියලු උප කාණ්ඩවල දායකත්වය සියයට 1.9 සිට සියයට 6.6ක පරාසයක් තුළ සිදු විය.

**දැනට කො.පා.මි. දර්ශකයෙහි පදනම් වර්ෂය 2002 වන අතර 2010 වර්ෂයේ දී එය 2006/2007 ලෙස සංශෝධනය කිරීමට අපේක්ෂා කෙරේ.** 2006/2007 වර්ෂවල පවත්වන ලද ගෘහස්ථ ආදායම් හා වියදම් පිළිබඳ සමීක්ෂණය පදනම් කරගෙන ආදායම් මට්ටමේ වර්ධනය සහ අභිරුචිය හා වරණය අනුව ගෘහස්ථ පරිභෝජන රටාවේ නවතම වෙනස් වීම් පිළිබිඹු කිරීමේ අරමුණෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කො.පා.මි.

**4.3 සංඛ්‍යා සටහන** **පරිපාලිත මිල සංශෝධන 2008 - 2009**

| අයිතමය | ඒකකය | මිල (වසර අවසානයේ දී) රුපියල් | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | | 2007 | 2008 | 2009 | 2008/2007 | 2009/2008 |
| සිගරට් (ගෝල්ඩ්ලීෆ්) | එකක් | 14.00 | 16.00 | 18.00 | 14.3 | 12.5 |
| සිගරට් (බ්‍රිස්ටල්/වයිස්රෝයි) | එකක් | 12.00 | 13.00 | 14.00 | 8.3 | 7.7 |
| පොල් අරක්කු | මි.ලී. 750 | 525.00 | 550.00 | 610.00 | 4.8 | 10.9 |
| අති විශේෂ අරක්කු | ,, | 450.00 | 500.00 | 565.00 | 11.1 | 13.0 |
| ඩීසල් | ලී. 1ක් | 75.00 | 70.00 | 73.00 | -6.7 | 4.3 |
| භූමිතෙල් | ,, | 68.00 | 50.00 | 51.00 | -26.5 | 2.0 |
| පෙට්‍රල් | ,, | 117.00 | 120.00 | 115.00 | 2.6 | -4.2 |
| ගෑස් - ෂෙල් | කි.ග්‍රෑ. 12.5 | 1,313.00 | 1,619.00 | 1,550.00 | 23.3 | -4.3 |
| ලාෆ් | කි.ග්‍රෑ. 12.5 | 1,248.00 | 1,403.00 | 1,421.00 | 12.4 | 1.3 |
| ඇවිතෙල් (1000) | ,, | 52.70 | 32.70 | 42.70 | -38.0 | 30.6 |
| ඇවිතෙල් (1500) | ,, | 51.70 | 31.70 | 41.70 | -38.7 | 31.5 |
| ඇවිතෙල් (3500) | ,, | 46.65 | 25.00 | 36.65 | -46.4 | 46.6 |
| විදුලිය ගාස්තු - ස්ථාවර ගාස්තු | ඒකක පරාසය | | | | | |
| | 0-30 | 60.00 | 60.00 | 60.00 | 0.0 | 0.0 |
| | 31-60 | 90.00 | 0.00 | 90.00 | 0.0 | 0.0 |
| | 61-90 | 120.00 | 120.00 | 120.00 | 0.0 | 0.0 |
| | 91-180 | 180.00 | 180.00 | 180.00 | 0.0 | 0.0 |
| | 180ට වැඩි | 240.00 | 240.00 | 240.00 | 0.0 | 0.0 |
| විදුලිය ගාස්තු - ඒකක ගාස්තු | ඒකක පරාසය | | | | | |
| | 0-30 | 3.00 | 3.00 | 3.00 | 0.0 | 0.0 |
| | 31-60 | 4.70 | 4.70 | 4.70 | 0.0 | 0.0 |
| | 61-90 | 7.50 | 7.50 | 7.50 | 0.0 | 0.0 |
| | 91-180 | 14.00 | 16.00 | 16.00 | 14.3 | 0.0 |
| | 180ට වැඩි | 19.80 | 25.00 | 25.00 | 26.3 | 0.0 |
| බස් ගාස්තු | | - | - | - | 17.6 | 5.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන 6**

## ශ්‍රී ලංකාව සඳහා නව මූලික උද්ධමන මිනුමක් හඳුන්වා දීම

### සංකල්පය, මිනුම් සහ අන්තර්ජාතික පරිචය

මිල ස්ථායීතාව, එනම් අඩු හා ස්ථායී උද්ධමන මට්ටමක් ළඟාකර ගැනීම සහ පවත්වා ගැනීම, ලොව බොහොමයක් මහ බැංකුවල ප්‍රමුඛ අරමුණ වේ. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිසියම් කාල පමාවකට පසු උද්ධමනය මත බලපෑම් කරන හෙයින් ඉදිරි කාලීන දැක්මකින් යුතුව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමටත්, එමගින් මිල ස්ථායීතාව ළඟාකර ගැනීමටත් මහ බැංකු කටයුතු කරති. සරල සහ පහසුවෙන් වැටහෙන මිනුමක් වශයෙන් සැලකෙන මතුපිට උද්ධමනය (Headline Inflation)[1] මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී බහුල වශයෙන් යොදා ගනු ලබන උද්ධමන මිනුම වේ. එම මිනුම තුළ කාලීන මිල වෙනස්වීම්, රජයේ බදු වෙනස්වීම් සහ ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන් වෙනස්වීම් යනාදී සියලුම ආකාරයේ මිල වෙනස්වීම් ඇතුළත් වේ. මෙම මිල ගණන් සියල්ල, විශේෂයෙන් වැඩි වශයෙන් උච්චාවචනය වන මිල ගණන් ඇතුළත් කිරීම නිසා මතුපිට උද්ධමනය ස්වභාවයෙන් ම බොහෝ සෙයින් විචලනය විය හැකි අතර, එමගින් ආර්ථිකයේ පවත්නා යටිදැරි උද්ධමනයේ (Underlying Inflation) දිශාව පෙන්නුම් නොකෙරේ.

එසේ හෙයින්, මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී මතුපිට උද්ධමනය මගින් ප්‍රයෝජනවත් තොරතුරු රැසක් සපයනු ලැබුව ද, මුදල් ප්‍රතිපත්ති කටයුතුවල දී ආර්ථිකයේ පවත්නා ඉල්ලුම් පීඩන තුළින් ඇති වන යටිදැරි උද්ධමන ප්‍රවණතා හඳුනා ගැනීමට ද ප්‍රතිපත්ති සම්පාදකයන්ට සිදුවේ. ඊට හේතුව, එසේ නොවනවිට සාර්ව ආර්ථික ස්ථායීතාවට බලපෑම් ඇති විය හැකි ආකාරයේ සාවද්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීමට ඉඩ ඇති බැවිනි. ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඵල හා සාර්ථක අයුරින් සිදු කිරීමේ දී මිල මට්ටමේ අඛණ්ඩ හෝ යටිදැරි වෙනස්වීම් විශ්ලේෂණය කිරීම අවශ්‍ය වේ. මූලික උද්ධමනය (Core Inflation) නමැති මිනුම මගින් යටිදැරි උද්ධමනයේ ප්‍රවණතා පිළිබඳ තොරතුරු සපයනු ලැබේ.

'මූලික උද්ධමනය' යන යෙදුම තත්කාලීන මුදල් ප්‍රතිපත්ති විෂය තුළ බොහෝ සෙයින් භාවිතා වුවද, ඒ පිළිබඳ පොදුවේ පිළිගත් න්‍යායාත්මක නිර්වචනයක් නොපවතී. නිදසුන් වශයෙන් බ්‍රයන් සහ චෙචෙට් (1993) යන දෙදෙනා දක්වා ඇත්තේ 'මූලික උද්ධමනය මුදල් සැපයුමේ වර්ධන අනුපාතිකය සමග සම්බන්ධ වන්නකි' යනුවෙනි. ක්වා සහ වාහී (1995) යන දෙදෙනා මූලික උද්ධමනය හඳුන්වා ඇත්තේ 'මැදිකාලීන හෝ දිගුකාලීන මූර්ත නිමැවුම මත කිසිදු බලපෑමක් නොකරන උද්ධමන සංරචකය' වශයෙන් වන අතර 'මූලික උද්ධමනය යනු උද්ධමනයේ දිගුකාලීන සංරචකයයි' යනුවෙන් බ්ලයින්ඩර් (1997) දක්වා තිබේ. මිෂ්කින්ගේ (2007) නිර්වචනය අනුව 'මූලික උද්ධමනය යනු ඉහළ විචලනයන් සහිත ඇතැම් මිල ගණන් දර්ශකයෙන් බැහැර කොට ගණනය කරනු ලැබූ උද්ධමන අනුපාතිකය' වේ.

මූලික උද්ධමනය ඍජුව නිරීක්ෂණය කළ නොහැකි බැවින්, එය මැනීම සඳහා විකල්ප ක්‍රම කිහිපයක් යෝජනා කර ඇත.[2] එමෙන්ම විවිධ ක්‍රම අනුසාරයෙන් ගණනය කරනු ලබන මූලික උද්ධමන මිනුම් තුළින් ලබාගන්නා විවිධ ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්තියට අදාළව විවිධ ප්‍රයෝජන සඳහා යොදාගත හැකි බව බොහෝ ආනුභවික පර්යේෂණ මගින් තහවුරු කොට ඇත. විවිධ ක්‍රමවේද අතුරින් අයිතම බැහැර කිරීමේ ක්‍රමය (Exclusion Method) මූලික උද්ධමනය මැනීමේ වඩාත් ප්‍රචලිත ක්‍රමය වේ. මෙම ක්‍රමයේ ප්‍රධාන ප්‍රයෝජන වන්නේ මතුපිට උද්ධමන තොරතුරු ඇති විට කිසිදු කාල පමාවකින් තොරව ගණනය කළ හැකිවීමත්, විනිවිද භාවය සහ සරල බව මෙන්ම සැසඳීම් කිරීමේ පහසුවයි. කෙසේ වුවද, අභිමත පරිදි අයිතම ඉවත් කිරීමේ හැකියාවක් තිබීම මෙම ක්‍රමයේ පවතින ප්‍රධාන දුර්වලතාව ලෙස සැලකිය හැකි ය.

### ශ්‍රී ලංකාවේ මූලික උද්ධමනය මැනීම

මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ප්‍රධාන වශයෙන් පදනම් වන්නේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම් මතය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන්, ආහාර මිල ගණන්වල සිදුවන අධික උච්චාවචනය සහ බලශක්ති හා ප්‍රවාහන මිල ගණන් රජයේ පාලනය මගින් වෙනස් කිරීම වැනි හේතු මත ශ්‍රී ලංකාවේ මතුපිට උද්ධමනය බොහෝ සෙයින් විචලනය වේ. කාලගුණ තත්ත්වය සහ බාහිර මිල කම්පන හේතුවෙන් ආහාර මිල ගණන්වල සිදුවන ප්‍රධාන වෙනස්වීම් නිසා කො.පා.මි. දර්ශකයෙහි වෙනස්වීම් ඇති වන අතර, ඒවා දර්ශකයේ නිරූපණය වන්නේ කෙටි කලකට පමණි. ඊට අමතරව, බලශක්ති සහ ප්‍රවාහන යනාදී මිල ගණන් ඇතුළත් පරිපාලන මිල ගණන් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිචාර නොදක්වන අතර, ක්ෂණිකව සිදුවන එබඳු වෙනස්කම් හේතුවෙන් සාමාන්‍ය මිල මට්ටමෙහි උපනතිය විකෘති වේ. එබඳු ඉහළ විචලනයක් සහිත අයිතමයන් වලට සමස්ත මිල දර්ශකයේ සැලකිය යුතු ප්‍රතිශතයක් හිමි වන අතර, එම මිල ගණන් ඇතුළත් කිරීම තුළින් සමස්ත මිල දර්ශකයේ නොමග යවන සුළු වෙනස්වීම් සිදු වේ.[3] මෙවැනි තත්ත්වයක් තුළ, ශ්‍රී ලංකාවේ යටිදැරි උද්ධමනයෙහි ප්‍රවණතා හඳුනා ගැනීම සඳහා අධි

1 මතුපිට උද්ධමනය යනු පාරිභෝගික මිල දර්ශකය වෙනස්වීමේ අනුපාතිකය වන අතර, එමගින් ආර්ථිකයේ පවත්නා සමස්ත උද්ධමනය මනිනු ලැබේ.

2 මූලික උද්ධමනය මැනීමේ විවිධ ක්‍රම පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් 2006 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ අඩංගු 'මූලික උද්ධමනය' යන විශේෂ සටහනෙහි සඳහන් වේ.

3 නිදසුන් වශයෙන්, ඉහළම විචලතාව ඇති අයිතම 10 සැලකූ විට එය සමස්ත මිල දර්ශකයෙන් සියයට 19 ක් වන අතර, ඉහළම විචලතාව ඇති අයිතම 20 සමස්ත දර්ශකයෙන් සියයට 40 ක ප්‍රමාණයකට සමාන වේ.

විචලනයෙන් සහ අසාමාන්‍ය කම්පනවලින් තොර වූ මූලික උද්ධමන මිනුමක් භාවිත කිරීම අත්‍යවශ්‍යය.

මුදල් ප්‍රතිපත්ති කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විවිධ මූලික උද්ධමන මිනුම් උපයෝගී කරගෙන ඇත. 1997 දී, ශ්‍රී ලංකා මහ බැංකුව, කො.පා.මි. දර්ශකයෙන් (1952 = 100) පරිපාලන මිල ගණන් සහිත අයිතම බැහැර කොට ප්‍රථමවරට මූලික උද්ධමන මිනුමක් ගණනය කරන ලදී. එතැන් සිට, මූලික උද්ධමන මිනුම වැඩි දියුණු කිරීම සඳහා විවිධ ක්‍රමවේද මත පදනම්ව ප්‍රයත්න ගණනාවක්ම දරනු ලැබ ඇති අතර, ඇතැම් මිනුම් මහජනතාවගේ දැන ගැනීම පිණිස ප්‍රසිද්ධ කරන ලදී. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2007 දී කො.පා.මි.ද. (2002 = 100) සංශෝධනය කරනු ලැබූ අවස්ථාවේ එම දර්ශකයෙන් ආහාර සහ බලශක්ති යන අයිතම බැහැර කොට නව මූලික උද්ධමන මිනුමක් සකස් කරන ලද අතර 2008 වසරේ ආරම්භයේ සිට එය ප්‍රසිද්ධ කරන ලදී.

2006/2007 කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණය පදනම් කොටගෙන කො.පා.මි. දර්ශකයෙහි යෝජිත සංශෝධනය හා සමගාමීව මූලික උද්ධමනය මැනීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සහ නව මූලික උද්ධමන මිනුමක් හඳුන්වා දීමේ අරමුණු ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූලික උද්ධමන මිනුම් ගණනාවක් ගණනය කොට ඇත. මෙම මිනුම් ජාත්‍යන්තර පරිචයන් මත පදනම්ව ඇති අතර, දැනට පවත්නා මිනුමෙහි දුර්වලතා රැසක් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම සඳහා එමගින් උත්සාහ දරා ඇත. මෙම මිනුම් සියල්ලම සංඛ්‍යානමය නිර්ණායක මත පදනම්ව ඇගයීමට ලක්කොට ඇත.[4] මෙම පරීක්ෂණ තුළින් තහවුරු වූයේ විවිධ මූලික උද්ධමන මිනුම් විසින් විවිධ සංඛ්‍යානමය නිර්ණායක සපුරනු ලබන අතර, යටිදැරි උද්ධමනයේ ප්‍රවණතා පිළිබඳ වඩාත් නිවැරදි මග පෙන්වීමක් සිදුකරනු ලබන බවයි.

මූලික උද්ධමන මිනුම්වල සාපේක්ෂ කාර්යසාධනය විමසන විට පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ මූලික උද්ධමනය ගණනය කිරීම සඳහා 'බැහැර කිරීමේ ක්‍රමය' වඩාත් සුදුසු බවයි. ඒ අනුව, මතුපිට උද්ධමන දර්ශකයෙන් 'නැවුම් ආහාර, සහල්, පොල්, බලශක්ති සහ ප්‍රවාහන' යන අයිතමවල මිල ගණන් බැහැර කොට නව මූලික උද්ධමන මිනුමක් සකස් කරන ලදී. මාළු, එළවළු සහ පළතුරු වැනි නැවුම් ආහාර මෙන්ම සහල් හා පොල් වැනි ආහාර ද්‍රව්‍ය මිල ගණන්වල ඉහළ විචලතාවක් පැවතීම මෙන්ම බලශක්ති හා ප්‍රවාහන මිල ගණන් පරිපාලනමය වශයෙන් තීරණය කිරීම යනාදි කරුණු මත මෙම අයිතම පමණක් බැහැර කිරීම සුදුසු වේ. විශේෂයෙන්, බැහැර කරනු ලබන අයිතම හා බැහැර කළ යුතු ප්‍රමාණය වැනි කරුණු අනුව සැලකූ විට මෙම මිනුම ජාත්‍යන්තර පරිචයන් සමග මනාව අනුකූල වේ. නියෝජනාත්මක මූලික උද්ධමන මිනුමක පැවතිය යුතු නිර්ණායක බොහොමයක් ද මෙම මිනුම විසින් සපුරා ඇති අතර පුළුල් වශයෙන් මතුපිට උද්ධමනය හා සමාන උපනතියක් එහි දක්නට ලැබේ.

මතුපිට උද්ධමන මිනුම හා සසඳන විට උද්ධමනයේ අඛණ්ඩ වෙනස්වීම් පිළිබඳ පුළුල් තොරතුරු ප්‍රමාණයක් සපයනු ලබන හෙයින්, මෙම නව මූලික උද්ධමන මිනුම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂිතය. එමෙන්ම, සරල බව සහ යළි ගණනය කිරීමේ පහසුව වැනි ලක්ෂණ හේතුවෙන් මෙම මූලික උද්ධමන මිනුම මහජනතාව විසින් මනා ලෙස වටහාගනු ලබනු ඇති අතර, එය උද්ධමනය පිළිබඳ අපේක්ෂා කළමනාකරණය කිරීමට උපකාරී වනු ඇත. කෙසේ වුවද, මිල ස්ථායීතාව යන්න අවසාන වශයෙන් සමස්ත මතුපිට උද්ධමනය පාලනය කිරීමට අදාළ වන හෙයින්, උද්ධමනය සඳහා බලපාන සාධක වඩාත් පරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කිරීම සඳහා මූලික උද්ධමනයේ උපනතීන් නිරීක්ෂණය කරන අතර, මතුපිට උද්ධමනය පිළිබඳව මහ බැංකුව තවදුරටත් සිය අඛණ්ඩ අවධානය යොමු කරනු ඇත.

**සංඛ්‍යා සටහන වි.ස. 6.1**

**මතුපිට සහ මූලික උද්ධමනයේ වෙනස්වීම් (% වෙනස්වීම්)**

| කාලපරිච්ඡේදය | මතුපිට උද්ධමනය | | මූලික උද්ධමනය | | | |
|---|---|---|---|---|---|---|
| | | | වර්තමාන මිනුම[1] | | නව මිනුම[2] | |
| | ලක්ෂ්‍යමය වෙනස | සාමාන්‍ය වෙනස | ලක්ෂ්‍යමය වෙනස | වාර්ෂික වෙනස | ලක්ෂ්‍යමය වෙනස | සාමාන්‍ය වෙනස |
| දෙසැ. 04 | 13.0 | 9.0 | 9.9 | 9.1 | 9.7 | 8.2 |
| දෙසැ. 05 | 7.4 | 11.0 | 9.2 | 10.3 | 8.5 | 10.8 |
| දෙසැ. 06 | 13.5 | 10.0 | 8.6 | 8.5 | 12.4 | 9.7 |
| දෙසැ. 07 | 18.8 | 15.8 | 8.1 | 7.7 | 17.0 | 12.8 |
| දෙසැ. 08 | 14.4 | 22.6 | 15.7 | 13.6 | 13.3 | 19.5 |
| මාර්තු 09 | 5.3 | 18.7 | 14.2 | 15.2 | 8.1 | 16.7 |
| ජූනි 09 | 0.9 | 12.5 | 7.7 | 15.2 | 6.3 | 12.9 |
| සැප්. 09 | 0.7 | 6.6 | 5.4 | 12.1 | 5.8 | 9.1 |
| දෙසැ. 09 | 4.8 | 3.4 | 5.9 | 9.2 | 5.8 | 7.0 |

1. කො.පා.මි. දර්ශකයෙන් (2002 = 100) ආහාර සහ බලශක්ති යන අයිතම බැහැර කොට ඇති අතර, එය සමස්ත දර්ශකයෙන් සියයට 54.9 ක ප්‍රමාණයකි.
2. කො.පා.මි. දර්ශකයෙන් (2002 = 100) නැවුම් ආහාර, සහල්, පොල්, බලශක්ති හා ප්‍රවාහන යන අයිතම බැහැර කොට ඇති අතර, එය සමස්ත දර්ශකයෙන් සියයට 31.1 ක ප්‍රමාණයකි.

මූලාශ්‍ර :

Blinder, A. (1997), Commentary on Measuring Short-Run Inflation for Central Bankers, *Federal Reserve Bank of St. Louis Review*, May/June, pp. 157-160.

Bryan, Michael F., and Stephen G. Cecchetti (1993), Measuring Core Inflation, NBER, Working Paper No. 4303, Cambridge.

Mishkin, Frederic S. (2007), Headline versus Core Inflation in the Conduct of Monetary Policy, Remarks at the Business Cycles, International Transmission and Macroeconomic Policies Conference, Montreal, October 2007.

Quah, Danny and Shaun, P. Vahey (1995), Measuring Core Inflation, *Economic Journal*, Vol. 105 (September), pp. 1130-44.

4 මූලික උද්ධමනයේ විචලතාව, මතුපිට උද්ධමනය, මූලික උද්ධමනය හා මුදල් සැපයුම අතර පවත්නා දිගුකාලීන සබඳතාව සහ මූලික උද්ධමනයේ ඇති පුරෝකථන හැකියාව යනාදී සංඛ්‍යානමය නිර්ණායක මෙහිදී පරීක්ෂා කරන ලදී.

දර්ශකයේ භාණ්ඩ පැසෙහි අයිතමයන් හා ඒවායේ බර තැබීම් යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදී. යාවත්කාලීන කරන ලද කො.පා.මි. දර්ශකය 2010 දී නිවේදනය කිරීමට අපේක්ෂා කෙරේ.

### තොග මිල දර්ශකය (තො.මි.ද.)

**තො.මි. දර්ශකය මගින් මනිනු ලබන ප්‍රාථමික වෙළඳපොළ තත්ත්වයේ උද්ධමනය 2009 දී අධික උච්චාවචනයක් පෙන්විය.** 2009 වසරේ මුල් මාස නවය තුළ ලක්ෂ්‍යමය පදනම මත එහි අවධමනකාරී උපනතියක් නිරීක්ෂණය කෙරිණි. තො.මි. දර්ශකයේ ලක්ෂ්‍යමය වැඩි වීම 2008 මැයි මස පැවැති ඉහළම මට්ටමක් වූ සියයට 42.1හි සිට 2009 සැප්තැම්බර් මාසයේ දී සියයට -0.4ක් දක්වා ශීඝ්‍රයෙන් පහළ ගියේය. අනතුරුව, එම උපනතිය වෙනස් වූ අතර, 2009 වසර අවසානයේ දී එහි ලක්ෂ්‍යමය ඉහළ යෑම සියයට 13.3 දක්වා ළඟා විය.

**තො.මි. දර්ශකය, වාර්ෂික සාමාන්‍ය පදනම අනුව 2009 වසර අග දී සියයට 4.2කින් පහළ වැටුණි.** ආහාර කාණ්ඩය සඳහා වූ උප දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය ඉහළ යෑම සියයට 0.6ක් විය. පෙට්‍රෝලියම්, වානේ නිෂ්පාදන, විදුලිය නිෂ්පාදන සහ විවිධ නිෂ්පාදන සඳහා වූ උප දර්ශක වාර්ෂික සාමාන්‍ය පදනම මත 2009 දී පිළිවෙළින් සියයට 22.8, සියයට 7.6, සියයට 1.0 සහ සියයට 24.4 වශයෙන් පහළ වැටිණි. භාණ්ඩවල සම්භවය අනුව වන වර්ගීකරණය සැලකූ විට, 2009 වර්ෂය තුළ දී වාර්ෂික සාමාන්‍ය පදනම මත දේශීය කාණ්ඩයෙහි මිල ගණන් සියයට 3.5කින් ඉහළ ගිය අතර, ආනයන හා අපනයන කාණ්ඩයන්හි මිල ගණන් පිළිවෙළින් සියයට 10.9ක සහ සියයට 6.7ක පහළ බැසීම් වාර්තා කළේය. ඒ අනුව, තො.මි.දර්ශකය මත පහළ යෑමේ පීඩනයක් ඇති කිරීමට ප්‍රධාන වශයෙන්ම, ජාත්‍යන්තර වෙළඳපොළේ මිල වර්ධනයන් හේතු වූ බව මෙමගින් පෙන්නුම් කෙරිණි. තිරිඟු ඇට, තිරිඟු පිටි, භූමිතෙල්, ඩීසල්, පෙට්‍රල් සහ කිරිපිටි මිල පහළ යෑම් ආනයන කාණ්ඩයේ මිල පහළ යෑමට දායක වූ අතර, පොල්, පොල් තෙල් සහ රබර් මිල පහළ යෑම අපනයන කාණ්ඩයේ පහත වැටීම සඳහා හේතු විය. තො.මි. දර්ශකයේ අවසන් භාවිතය පිළිබඳ වර්ගීකරණයට අනුව, වර්ෂය අවසානයේ දී, වාර්ෂික සාමාන්‍ය පදනම මත අතරමැදි කාණ්ඩයේ මිල ගණන් සියයට 21.8කින් තියුණු ලෙස පහළ වැටුණු අතර, පාරිභෝගික සහ ආයෝජන යන කාණ්ඩ දෙකෙහිම පිළිවෙළින් සියයට 2.6ක සහ සියයට 2.4ක ඉහළ යෑම් වාර්තා විය. දුම්කොළ, තිරිඟු ඇට, භූමිතෙල්, ඩීසල්, කොකෝවා, රබර් සහ පරිවෘත කම්බිවල මිල ගණන් අඩු වීම අතරමැදි කාණ්ඩයේ මිල පහළ යෑමට හේතු විය.

**4.4 සංඛ්‍යා සටහන** — **දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය**

| අංශය | දර්ශකය | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | 2007(අ) | 2008 | 2009(ආ) | 2008/07(අ) | 2009/08(ආ) |
| කෘෂිකාර්මික | 260.7 | 342.2 | 341.7 | 31.3 | -0.2 |
| කාර්මික | 266.1 | 304.0 | 322.9 | 14.2 | 6.2 |
| සේවා | 249.3 | 285.1 | 304.2 | 14.4 | 6.7 |
| **ද.දේ.නි.** | **256.4** | **298.3** | **315.1** | **16.3** | **5.7** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

### දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

**උද්ධමනය මැනීමේ විකල්ප මිණුමක් වන දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකයට අනුව 2008 වසරේ වාර්තා වූ සියයට 16.3ට සාපේක්ෂව සමස්ත මිල වැඩි වීම 2009 වසරේ දී සියයට 5.7 දක්වා පහළ යෑමක් පෙන්වීය.** පසුගිය දෙවසර තුළ දක්නට ලැබුණු උපනතියට ප්‍රතිවිරුද්ධව කෘෂිකාර්මික අංශය, 2008 වර්ෂයේ වාර්තා කළ ඉහළම උද්ධමනය වූ සියයට 31.3ට එරෙහිව 2009 දී සියයට -0.2ක පහළම අගයක් වාර්තා කළේය. සේවා අංශය 2009 වර්ෂයේ දී ඉහළම උද්ධමන අනුපාතිකය වන සියයට 6.7 ක් වාර්තා කළ ද, එය 2008 වර්ෂයේදී එම අංශය විසින් වාර්තා කරන ලද සියයට 14.4ට වඩා සැලකිය යුතු ලෙස අඩුය. කර්මාන්ත අංශයේ උද්ධමනය ද 2008 වසරේ දී පැවැති සියයට 14.2ට සාපේක්ෂව 2009 දී සියයට 6.2 දක්වා අඩු විය.

## 4.3 වැටුප්

**රාජ්‍ය සහ පෞද්ගලික යන දෙ අංශයෙහිම සේවකයන්ගේ නාමික වැටුප්වල වැඩි වීම් 2009 වර්ෂයේ දී වාර්තා විය.** රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක, පඩි පාලක සභා මගින් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ අවම වැටුප් ප්‍රමාණ දර්ශක සහ අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප්වල නාමික අගයෙහි පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩි වීමක් 2009 වර්ෂයේ දී වාර්තා විය. ඒ සමඟම ප්‍රධාන වශයෙන් උද්ධමනය පහළ යෑම හේතුවෙන් මූර්ත වැටුප්වල වැඩි වීමක් ද මෙම සේවකයන් විසින් 2009 වර්ෂය තුළ දී භුක්ති විඳින ලදී.

### රාජ්‍ය අංශයේ වැටුප්

**රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් 2009 වර්ෂයේ දී වැඩි විය.** පහත වැටෙමින් පැවති උද්ධමනයත්, රාජ්‍ය අංශයේ සේවකයන්ට මාසිකව ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව වර්ෂය තුළ දී දෙ වතාවක් වැඩි කිරීම නිසා නාමික වැටුප්වල වැඩි වීමත් හේතුවෙන්

රාජ්‍ය අංශයේ සියලුම කාණ්ඩවල සේවකයන්ගේ මූර්ත වැටුප්වල, 2008 වර්ෂයේ දී පැවති මූර්ත වැටුප් අඩු වීමට එරෙහිව සැලකිය යුතු ඉහළ යෑමක් 2009 වර්ෂය තුළ දී පෙන්නුම් කෙරිණි. විධායක නොවන සේවකයන්, පාසල් ගුරුවරුන් සහ සුළු සේවකයන්ගේ වැටුප් ඇතුළත් රාජ්‍ය සේවකයන්ගේ නාමික වැටුප් දර්ශකවල වැඩි වීමට ප්‍රධානම හේතුව වූයේ රාජ්‍ය සේවකයන් සඳහා ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව 2009 ජනවාරි මාසයේ දී සහ නොවැම්බර් මාසයේ දී පිළිවෙළින් රුපියල් 1,000කින් සහ රුපියල් 750කින් ඉහළ දැමීමයි. ජීවන වියදම් දීමනාවේ මෙම වැඩි කිරීම් සමඟ රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය සහ සන්නද්ධ සේවා ඇතුළු සියලුම කාණ්ඩවල රජයේ සේවකයන්ට ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව රුපියල් 3,500 සිට රුපියල් 5,250 දක්වා වැඩි විය. එසේම, දෛනික වැටුප් ලබන සේවකයන් සඳහා ගෙවනු ලබන දීමනාව ද වැඩ කරන දිනකට රුපියල් 116.66 සිට රුපියල් 150 දක්වා 2009 ජනවාරි මාසයේ දී වැඩි කළ අතර, එය නොවැම්බර් මාසයේ දී රුපියල් 175 දක්වා තවදුරටත් වැඩි කරන ලදී. මෙම වැඩිකිරීම් හේතුවෙන් රාජ්‍ය සේවකයන්ගේ සමස්ත නාමික වැටුප් දර්ශකය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 9.4කින් වැඩි විය. ඒ අනුව, විධායක නොවන නිලධාරීන්ගේ, සුළු සේවකයන්ගේ සහ රජයේ පාසල් ගුරුවරුන්ගේ නාමික වැටුප් දර්ශකවල 2008 වර්ෂයේ දී සියයට 7-8 පරාසයක සිදු වූ වැඩි වීම හා සසඳන විට 2009 වර්ෂය තුළ දී පිළිවෙළින් සියයට 8.9, සියයට 10.0 සහ සියයට 9.4කින් වැඩි විය. නාමික වැටුප් ඉහළ යෑමෙහි සහ උද්ධමනය පහත වැටීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස 2009 වර්ෂයේ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුපෙහි ඉහළ යෑමක් වාර්තා විය. ඒ අනුව, 2008 වර්ෂයේ දී සියයට 12.2-12.5 අතර පරාසයකින් අත් විඳින ලද මූර්ත වැටුප් පහත වැටීම හා සැසඳීමේ දී මෙම විධායක නොවන නිලධාරීන්, සුළු සේවකයන් සහ පාසල් ගුරුවරුන් විසින් 2009 දී පිළිවෙළින් සියයට 5.3ක, සියයට 6.3ක සහ සියයට 5.7ක මූර්ත වැටුප් ඉහළ යෑමක් භුක්ති විඳින ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස මධ්‍යම රජයේ සේවකයන්ගේ සමස්ත මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය ද 2009 වර්ෂය තුළ දී පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 5.7කින් වැඩි විය.

### විධිමත් පෞද්ගලික අංශයේ වැටුප්

**පඩි පාලක සභාවල නියමයන් යටතේ පාලනය වනු ලබන සේවක කාණ්ඩයන්ගේ අවම වැටුප් පමණක් ආවරණය වන අවම වැටුප් ප්‍රමාණ දර්ශක මගින්, විධිමත් පෞද්ගලික අංශයේ වැටුප්හි විචලනයන් අධීක්ෂණය කරනු ලැබේ.** විධිමත් පෞද්ගලික අංශයේ ප්‍රධාන අංශයන් වන කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශයන්හි අවම නාමික වැටුප් ප්‍රමාණ දර්ශක පිළිවෙළින් සියයට 2.7, සියයට 9.4 හා සියයට 12.8කින් 2009 වර්ෂයේ දී ඉහළ ගිය අතර, සියලුම කාණ්ඩ සඳහා වූ සමස්ත වැටුප් ප්‍රමාණ දර්ශකය 2008 වර්ෂයට සාපේක්ෂව සියයට 4.9කින් වැඩි විය. මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 2008 ජූලි මාසයේ දී කර්මාන්ත හා වාණිජ අංශයේ සහ සේවා අංශයේ සේවකයන්ගේ අවම වැටුප් වැඩි වීමයි.

**නාමික වැටුප් ප්‍රමාණ දර්ශකවල වැඩි වීම උද්ධමනය සමඟ ගැලපූ විට මූර්ත වැටුප්වල වැඩි වීමක් විධිමත් පෞද්ගලික අංශයෙහි කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශවල සේවකයන් විසින් 2009 වර්ෂයේ දී භුක්ති විඳින ලදී.** පඩි පාලක සභා මගින් පාලනය වන සේවකයන් සඳහා වන සමස්ත මූර්ත

**4.5 සංඛ්‍යා සටහන**

**වැටුප් ප්‍රමාණ දර්ශක**

(1978 දෙසැම්බර් = 100)

| සේවක කාණ්ඩ | දර්ශකය | | | | | | ප්‍රතිශත වෙනස | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නාමික | | | මූර්ත (අ) | | | නාමික | | | මූර්ත (අ) | | |
| | 2007 | 2008 | 2009(ආ) | 2007 | 2008 | 2009(ආ) | 2007 | 2008 | 2009(ආ) | 2007 | 2008 | 2009(ආ) |
| 1. රජයේ සේවකයන් | | | | | | | | | | | | |
| මධ්‍යම රජයේ සේවකයන් | **3,3,828.4** | **4,116.1** | **4,502.9** | **171.6** | **150.4** | **159.0** | **21.5** | **7.5** | **9.4** | **5.0** | **-12.4** | **5.7** |
| විධායක නොවන | 3,493.4 | 3,749.5 | 4,082.4 | 156.6 | 137.0 | 144.2 | 22.4 | 7.3 | 8.9 | 5.7 | -12.5 | 5.3 |
| සුළු සේවකයන් | 4,172.7 | 4,494.7 | 4,943.5 | 187.0 | 164.2 | 174.6 | 20.5 | 7.7 | 10.0 | 4.1 | -12.2 | 6.3 |
| රජයේ පාසල් ගුරුවරුන් | 2,740.0 | 2,938.6 | 3,215.3 | 122.8 | 107.4 | 113.5 | 18.9 | 7.2 | 9.4 | 2.7 | -12.5 | 5.7 |
| 2. පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | | | | | | | |
| සියලුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | **1,648.8** | **2,070.4** | **2,171.4** | **73.6** | **75.5** | **76.7** | **21.4** | **25.6** | **4.9** | **4.1** | **2.6** | **1.6** |
| කෘෂිකර්මාන්තයෙහි නියැලුණු කම්කරුවන් | 1,821.4 | 2,286.6 | 2,349.4 | 81.3 | 83.5 | 83.0 | 16.2 | 25.5 | 2.7 | -0.3 | 2.6 | -0.6 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලුණු කම්කරුවන් | 1,522.4 | 1,877.5 | 2,054.0 | 67.9 | 68.5 | 72.5 | 39.6 | 23.3 | 9.4 | 19.6 | 0.9 | 5.8 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 1,057.1 | 1,370.8 | 1,545.8 | 47.1 | 49.9 | 54.6 | 35.6 | 29.7 | 12.8 | 16.0 | 5.9 | 9.4 |

(අ) මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක කො.පා.මි.ද. (2002 = 100) පදනම් කොට ගෙන ගැලපුම් කර ඇත.
(ආ) තාවකාලික

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වැටුප් ප්‍රමාණ දර්ශකය, පසුගිය වර්ෂයට සාපේක්ෂව 2009 වර්ෂයේ දී සියයට 1.6කින් වැඩි වූ අතර, එය ප්‍රධාන වශයෙන්ම උද්ධමන අනුපාතිකයේ තියුණු පහළ යෑම නිසා සිදු විය. මේ අතර, සේවා අංශයේ සහ කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයන් 2009 වර්ෂයේ දී පිළිවෙළින් සියයට 9.4ක හා සියයට 5.8ක සැලකිය යුතු මූර්ත වැටුප් වැඩි වීමක් භුක්ති විඳින ලදී. කෙසේ නමුත්, කෘෂිකාර්මික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් පසුගිය වර්ෂයේ සියයට 2.6ක වැඩි වීමට සාපේක්ෂව 2009 වර්ෂයේ දී සියයට 0.6කින් පහත වැටිණි.

### අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප්

අඛණ්ඩව කරනු ලබන සමීක්ෂණයක් පදනම්ව සකස් කරන අවිධිමත් පෞද්ගලික අංශයේ සියලුම රැකියාවල නාමික වැටුප් 2009 වර්ෂයේ දී වැඩි විය. සාමාන්‍යයෙන්, ආර්ථිකයේ පවතින ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයත්, ඒ ඒ ක්ෂේත්‍රවල කම්කරුවන් බලාපොරොත්තු වන අවම වැටුප් මට්ටමත් පිළිබිඹු වන අයුරින් අසංවිධිත අංශයේ වැටුප් තීරණය වේ. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ යටතේ කෘෂිකාර්මික හා ඉදිකිරීම් අංශ ආවරණය වන පරිදි අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් පිළිබඳ තොරතුරු එක්රැස් කරනු ලබන අතර, එමගින් 2009 වර්ෂය තුළ දී මෙම අංශවලනාමික වැටුප්හි වර්ධනයක් පෙන්නුම් කෙරේ. ඒ අනුව, පසුගිය වසර හා සසඳන විට 2009 වර්ෂයේ දී කෘෂිකාර්මික හා ඉදිකිරීම් අංශවල පිළිවෙළින් සියයට 10.0ක හා සියයට 11.1ක දෛනික වැටුප් වැඩි වීමක් වාර්තා විය. කෘෂිකාර්මික අංශයේ වී, පොල්, රබර් සහ තේ යන උප කාණ්ඩවල සාමාන්‍ය දෛනික වැටුප් 2008 වර්ෂය හා සැසඳීමේ දී පිළිවෙළින් සියයට 8.4, සියයට 10.1, සියයට 8.0 සහ සියයට 14.2කින් 2009 දී වැඩි වී ඇත. කෘෂිකාර්මික අංශයේ බොහෝ උප කාණ්ඩවල දෛනික වැටුප්වල ඉහළ යෑම එකිනෙකට වෙනස් වූ අතර, එය එකිනෙකට වෙනස් වූ ක්‍රියාකාරකම්වල විවිධත්වය හා ශ්‍රම සැපයුම නිසා සිදු වූවකි. මීට අමතරව, මෙම උප කාණ්ඩවල සේවකයන් තම මූර්ත වැටුප යම් මට්ටමක පවත්වාගෙන යෑම සඳහා වැඩි දෛනික වැටුප් වෙනුවෙන් කරන ලද ඉල්ලීම්වල බලපෑම ද මෙම උප කාණ්ඩවල වැටුප් ප්‍රමාණ ඉහළ යෑමට හේතු වී ඇත. එසේම,

**4.6 සංඛ්‍යා සටහන**

**අංශය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් (අ)**

| අංශය | වාර්ෂික සාමාන්‍යය (රු.) | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | නාමික | | මූර්ත (ආ) | |
| | 2007 | 2008 | 2009 (ඇ) | 2008 | 2009 (ඇ) | 2008 | 2009 (ඇ) |
| 1. කෘෂිකාර්මික අංශය | | | | | | | |
| තේ | | | | | | | |
| පුරුෂ | 375 | 440 | 496 | 17.4 | 12.6 | -4.2 | 8.8 |
| ස්ත්‍රී | 263 | 305 | 356 | 16.1 | 16.5 | -5.2 | 12.6 |
| රබර් | | | | | | | |
| පුරුෂ | 389 | 500 | 532 | 28.4 | 8.5 | 4.8 | 2.9 |
| ස්ත්‍රී | 277 | 377 | 416 | 36.3 | 10.1 | 11.2 | 6.4 |
| පොල් (ඈ) | | | | | | | |
| පුරුෂ | 479 | 590 | 652 | 23.1 | 10.5 | 0.5 | 6.8 |
| වී | | | | | | | |
| පුරුෂ | 456 | 562 | 615 | 23.2 | 9.4 | 0.5 | 5.8 |
| ස්ත්‍රී | 336 | 395 | 423 | 17.6 | 7.0 | -4.0 | -3.5 |
| 2. ඉදිකිරීම් අංශය (ඈ) | | | | | | | |
| වඩුකාර්මික | | | | | | | |
| වඩුකාර්මික - පිරිමි | 732 | 844 | 932 | 15.3 | 10.4 | -5.9 | 6.7 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 479 | 558 | 617 | 16.6 | 10.6 | -4.9 | 6.9 |
| පෙදරේරු | | | | | | | |
| පෙදරේරු - පිරිමි | 727 | 837 | 935 | 15.1 | 11.7 | -6.1 | 8.0 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 474 | 561 | 627 | 18.4 | 11.7 | -3.4 | 8.0 |

(අ) වැටුප් විස්තර මධ්‍යස්ථාන 90 ක මාසික වැටුප් පදනම්කොට ගෙන සකස් කර ඇත.
(ආ) මූර්ත වැටුප් ප්‍රතිශත වෙනස කො.පා.මි.ද. (2002=100) පදනම් කොට ගෙන ගැලපුම් කර ඇත.
(ඇ) තාවකාලික
(ඈ) පොල් වගා සහ ඉදිකිරීම් අංශවල කාන්තා සහභාගීත්වය අවම මට්ටමක පවතී.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වර්ෂයේ අග භාගය වන විට තේ සහ රබර් වැනි සමහර අපනයන භාණ්ඩවල ජාත්‍යන්තර වෙළඳපොළේ මිල ගණන් වැඩි වීම නිසා සිය සේවකයන්ට වැඩි වැටුපක් ගෙවීමට නිෂ්පාදකයන්ට හැකියාව ලැබිණි. ඒ අනුව, කෘෂිකාර්මික අංශයේ සහ ඉදිකිරීම් අංශයේ සියලුම උපකාණ්ඩවල සේවකයන්ගේ මූර්ත වැටුප්වල සැලකිය යුතු වැඩි වීමක් 2009 වර්ෂයේ දී වාර්තා විය. කෘෂිකාර්මික අංශයේ උප කාණ්ඩ වන තේ, රබර්, පොල් සහ වී වගාවන්හි නියුතු සේවකයන්ගේ මූර්ත වැටුප 2009 වර්ෂයේ දී පිළිවෙළින් සියයට 10.4, සියයට 4.4, සියයට 6.5 සහ සියයට 4.8ක වැඩි වීමක් පෙන්නුම් කෙරිණි. මේ අතර, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වඩු හා පෙදරේරු අංශවල මූර්ත වැටුප්හි සියයට 7-8ක පමණ වැඩි වීමක් වාර්තා වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වන්නට ඇත්තේ සමහර ප්‍රදේශවල පුහුණු සේවක හිඟයක් පැවතීමය. 2008 වර්ෂයේ දී මෙම සේවකයන් අත් විඳින ලද මූර්ත වැටුප් අඩුවීම සමඟ සැසඳීමේ දී මෙය කැපී පෙනෙන වර්ධනයකි.

## 4.4 ජනගහනය, ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය

### ජනගහනය

**2009 වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 20.45ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, 2008 දී සියයට 1.0ක් වූ ජනගහන වර්ධනයට සාපේක්ෂව 2009 වසරේ දී සියයට 1.1ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.** ජනගහනයේ වැඩි වීම දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත. 2009 සමස්ත වැඩි වීමෙන් සියයට 55 කට වඩා වැඩි දායකත්වයක් ජනගහනයේ ඉහළ වැඩි වීම් වාර්තා කළ කොළඹ, මහනුවර, කුරුණෑගල, රත්නපුර, ගම්පහ, බදුල්ල, ගාල්ල සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කවලින් ලැබී ඇත.

### ශ්‍රම බලකාය

**කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව[1] වයස අවුරුදු 10 හා ඊට වැඩි, ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය ලෙස හඳුන්වනු ලබන ශ්‍රම බලකාය, පසුගිය වර්ෂයේ මිලියන 8.08ට සාපේක්ෂව 2009 වර්ෂයේ දී මිලියන 8.07 දක්වා සියයට 0.1කින් සුළු වශයෙන් අඩු විය.** මේ අතර, උතුරු හා නැගෙනහිර පළාත් දෙක ම හැර ශ්‍රම බලකාය 2009 දී මිලියන 7.57ක් ලෙස නොවෙනස්ව පැවතිණි.

**4.7 සංඛ්‍යා සටහන — දිස්ත්‍රික්ක මට්ටමෙන් ජනගහනය**

පුද්ගලයන් '000

| දිස්ත්‍රික්කය | 2008 | 2009 (අ) | වෙනස (අ) | ප්‍රතිශත වෙනස (අ) |
|---|---|---|---|---|
| කොළඹ | 2,488 | 2,521 | 33 | 1.3 |
| මහනුවර | 1,396 | 1,415 | 19 | 1.4 |
| රත්නපුරය | 1,099 | 1,113 | 14 | 1.3 |
| බදුල්ල | 861 | 874 | 13 | 1.5 |
| කුරුණෑගල | 1,535 | 1,550 | 15 | 1.0 |
| ගම්පහ | 2,152 | 2,165 | 13 | 0.6 |
| ගාල්ල | 1,063 | 1,074 | 11 | 1.0 |
| අනුරාධපුරය | 809 | 820 | 11 | 1.4 |
| කළුතර | 1,118 | 1,128 | 10 | 0.9 |
| මාතර | 822 | 831 | 9 | 1.1 |
| නුවරඑළිය | 749 | 755 | 6 | 0.8 |
| අම්පාර | 624 | 634 | 10 | 1.6 |
| මඩකලපුව | 530 | 537 | 7 | 1.3 |
| පුත්තලම | 760 | 770 | 10 | 1.3 |
| යාපනය | 603 | 607 | 4 | 0.7 |
| මාතලේ | 483 | 490 | 7 | 1.4 |
| ත්‍රිකුණාමලය | 361 | 368 | 7 | 1.9 |
| හම්බන්තොට | 558 | 565 | 7 | 1.3 |
| මොණරාගල | 430 | 435 | 5 | 1.2 |
| පොළොන්නරුව | 400 | 405 | 5 | 1.3 |
| මුලතිව් | 150 | 154 | 4 | 2.7 |
| කිලිනොච්චිය | 150 | 154 | 4 | 2.7 |
| වව්නියාව | 167 | 169 | 2 | 1.2 |
| කෑගල්ල | 807 | 813 | 6 | 0.7 |
| මන්නාරම | 102 | 103 | 1 | 1.0 |
| **එකතුව** | **20,217** | **20,450** | **233** | **1.1** |

(අ) තාවකාලික

මූලයː රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව

**මුළු ශ්‍රම බලකාය, මිලියන 7.60ක් වන සේවා නියුක්තිකයන්ගෙන් සහ මිලියන 0.47ක් වන සේවා වියුක්තිකයන්ගෙන් සමන්විත වේ.** මේ අතර, වයස අවුරුදු 10 හා ඊට වැඩි ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලබන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය, පසුගිය වර්ෂයේ පැවැති සියයට 49.5 සිට 2009 දී සියයට 48.7 දක්වා පහත වැටිණි. මෙම පහත වැටීම පුරුෂ හා ස්ත්‍රී දෙ පක්ෂයේම ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතවල දක්නට ලැබුණු අතර, එය පිළිවෙළින් සියයට 66.6ක් හා සියයට 32.8ක් ලෙස වාර්තා විය. පසුගිය වර්ෂවල ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය ස්ත්‍රී පුරුෂ භාවය අනුව විශ්ලේෂණය කළ විට, මෑත වර්ෂවල දී පුරුෂ අනුපාතය ස්ත්‍රී අනුපාතය මෙන් දෙ ගුණයක් පමණ වූ බව වාර්තා වේ.

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය පදනම්ව ශ්‍රම බලකාය, සේවානියුක්තිය සහ සේවාවියුක්ති මට්ටම හා එහි ප්‍රවණතාවයන් විශ්ලේෂණය කරනු ලැබේ. 2008 පළමු කාර්තුවේ සිට නැගෙනහිර පළාත ද ඇතුළත් වන පරිදි කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය ව්‍යාප්ත කරන ලදී. කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය තුළින් මුළු දිවයිනම ආවරණය වන පරිදි සමීක්ෂණ නියැදිය පුළුල් කිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර තිබුණ ද, ඇතැම් දිස්ත්‍රික්කවල පැවැති අවිනිශ්චිත තත්ත්වය හේතු කොට ගෙන පසුගිය වසර කිහිපය තුළ දී උතුරු පළාත මුළුමනින්ම ආවරණය කර ගැනීමට නොහැකි විය. ඒ අනුව, විශේෂයෙන් සඳහන් කර නොමැති සෑම අවස්ථාවක දී ම උතුරු පළාත හැර සෙසු දිස්ත්‍රික්කවල ශ්‍රම බලකා සමීක්ෂණවල දත්ත පමණක් විශ්ලේෂණය සඳහා භාවිතා කර ඇත.

**4.8 සංඛ්‍යා සටහන**

**කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය**

| ශීර්ෂය | 2007 (අ) | 2008 (අ) | 2008 (ආ) | 2009 (අ) පළමු කාර්තුව | 2009 (අ) දෙවන කාර්තුව | 2009 (අ) තෙවන කාර්තුව | 2009 (අ) සිව්වන කාර්තුව | 2009 (අ) වාර්ෂික | 2009 (ආ) පළමු කාර්තුව | 2009 (ආ) දෙවන කාර්තුව | 2009 (ආ) තෙවන කාර්තුව | 2009 (ආ) සිව්වන කාර්තුව | 2009 (ආ) වාර්ෂික |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කුටුම්බ ජනගහනය (ඇ) පුද්ගලයන් '000 | 15,048 | 15,079 | 16,320 | 15,353 | 15,348 | 15,475 | 15,415 | 15,398 | 16,569 | 16,493 | 16,667 | 16,585 | 16,578 |
| ශ්‍රම බලකාය පුද්ගලයන් '000 | 7,489 | 7,569 | 8,082 | 7,659 | 7,469 | 7,626 | 7,536 | 7,572 | 8,160 | 7,961 | 8,122 | 8,051 | 8,074 |
| සේවා නියුක්ත | 7,042 | 7,175 | 7,648 | 7,251 | 6,999 | 7,184 | 7,125 | 7,140 | 7,710 | 7,465 | 7,642 | 7,593 | 7,602 |
| සේවා වියුක්ත | 447 | 394 | 434 | 408 | 470 | 442 | 411 | 433 | 450 | 496 | 480 | 459 | 471 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඈ)% | 49.8 | 50.2 | 49.5 | 49.9 | 48.7 | 49.3 | 48.9 | 49.2 | 49.2 | 48.3 | 48.7 | 48.5 | 48.7 |
| පුරුෂ | 67.8 | 67.9 | 68.0 | 67.4 | 66.5 | 66.3 | 66.5 | 66.7 | 67.2 | 66.0 | 66.2 | 66.5 | 66.6 |
| ස්ත්‍රී | 33.4 | 34.3 | 33.0 | 34.3 | 32.8 | 34.3 | 33.5 | 33.7 | 33.3 | 32.0 | 33.2 | 32.9 | 32.8 |

(අ) උතුරු හා නැගෙනහිර පළාත් දෙකෙහි දත්ත ඇතුළත් කර නොමැත.
(ආ) උතුරු පළාතෙහි දත්ත ඇතුලත් කර නොමැත.
(ඇ) වයස අවු. 10 සහ ඊට වැඩි කුටුම්භ ජනගහනය
(ඈ) ශ්‍රම බලකාය, වයස අවුරුදු 10 හා ඊට වැඩි කුටුම්භ ජනගහණයේ ප්‍රතිශතයක් ලෙස

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සේවා නියුක්තිය

කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, 2008 දී මිලියන 7.65ක් වූ සේවා නියුක්තිකයන්[2] සංඛ්‍යාව, 2009 වර්ෂයේ දී මිලියන 7.60ක් දක්වා සියයට 0.6කින් අඩු විය. වර්ෂය තුළ ආර්ථික ක්‍රියාකාරකම්වල ඇති වූ පසුබෑමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රමය සඳහා ඇති ඉල්ලුම පහළ වැටීම මෙම අඩු වීමට හේතු විය. එමෙන්ම, උතුරු හා නැගෙනහිර යන පළාත් දෙක හැර සලකා බලන විට 2009 දී සේවා නියුක්තිය මිලියන 7.14ක් වූ අතර, එය 2008 වසරෙහි මිලියන 7.18 හා සැසඳීමේ දී සියයට 0.5ක ආන්තික අඩු වීමකි.

සේවා නියුක්ති ජනගහනයෙහි සංයුතිය ප්‍රධාන කර්මාන්ත කාණ්ඩ අතරේ බෙදී ගොස් ඇති ආකාරය මෙම කාලපරිච්ඡේද දෙක අතර වෙනස්

**4.9 සංඛ්‍යා සටහන**

**ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය**

| අංශය | පුද්ගලයන් '000 2007 (අ) | 2008 (අ) | 2008 (ආ) | 2009 (අ) පළමු කාර්තුව | 2009 (අ) දෙවන කාර්තුව | 2009 (අ) තෙවන කාර්තුව | 2009 (අ) සිව්වන කාර්තුව | 2009 (අ) වාර්ෂික | 2009 (ආ) පළමු කාර්තුව | 2009 (ආ) දෙවන කාර්තුව | 2009 (ආ) තෙවන කාර්තුව | 2009 (ආ) සිව්වන කාර්තුව | 2009 (ආ) වාර්ෂික | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය 2007 (අ) | 2008 (අ) | 2008 (ආ) | 2009 (අ) | 2009 (ආ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මය** | **2,202** | **2,344** | **2,490** | **2,460** | **2,227** | **2,292** | **2,295** | **2,319** | **2,613** | **2,383** | **2,426** | **2,481** | **2,476** | **31.3** | **32.7** | **32.6** | **32.5** | **32.6** |
| **කර්මාන්ත** | **1,874** | **1,888** | **2,005** | **1,806** | **1,804** | **1,833** | **1,848** | **1,823** | **1,894** | **1,914** | **1,912** | **1,921** | **1,910** | **26.6** | **26.3** | **26.2** | **25.5** | **25.1** |
| නිමැවුම් කර්මාන්ත | 1,331 | 1,355 | 1,414 | 1,297 | 1,251 | 1,308 | 1,349 | 1,301 | 1,349 | 1,310 | 1,353 | 1,380 | 1,348 | 18.9 | 18.9 | 18.5 | 18.2 | 17.7 |
| ඉදිකිරීම් (ඇ) | 543 | 533 | 590 | 509 | 552 | 526 | 499 | 522 | 546 | 604 | 559 | 541 | 562 | 7.7 | 7.4 | 7.7 | 7.3 | 7.4 |
| **සේවා** | **2,966** | **2,943** | **3,154** | **2,985** | **2,969** | **3,059** | **2,982** | **2,999** | **3,202** | **3,168** | **3,304** | **3,191** | **3,216** | **42.1** | **41.0** | **41.2** | **42.0** | **42.3** |
| වෙළඳාම සහ හෝටල් ආදිය | 1,051 | 1,028 | 1,095 | 1,055 | 996 | 1,086 | 1,050 | 1,047 | 1,113 | 1,074 | 1,172 | 1,115 | 1,119 | 14.9 | 14.3 | 14.3 | 14.7 | 14.7 |
| ප්‍රවාහන, ගබඩා කිරීම සහ සන්නිවේදනය | 457 | 426 | 448 | 408 | 445 | 407 | 418 | 420 | 430 | 467 | 437 | 447 | 445 | 6.5 | 5.9 | 5.9 | 5.9 | 5.9 |
| මූල්‍ය, රක්ෂණ සහ නිශ්චල දේපල | 215 | 236 | 241 | 243 | 221 | 216 | 204 | 221 | 246 | 229 | 222 | 210 | 227 | 3.1 | 3.3 | 3.2 | 3.1 | 3.0 |
| පෞද්ගලික සේවා සහ අදාළ වෙනත් සේවා | 1,243 | 1,253 | 1,370 | 1,280 | 1,307 | 1,349 | 1,514 | 1,362 | 1,413 | 1,398 | 1,473 | 1,419 | 1,426 | 17.7 | 17.5 | 17.9 | 19.1 | 18.8 |
| **මුළු සේවා නියුක්තිය** | **7,042** | **7,175** | **7,648** | **7,251** | **6,999** | **7,184** | **7,125** | **7,140** | **7,710** | **7,465** | **7,642** | **7,593** | **7,603** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| ශ්‍රම බලකායේ ප්‍රතිශතය | 94.0 | 94.8 | 94.6 | 94.7 | 93.7 | 94.2 | 94.5 | 94.3 | 94.5 | 93.8 | 94.1 | 94.3 | 94.2 | | | | | |

(අ) උතුරු හා නැගෙනහිර පළාත් දෙකෙහි දත්ත ඇතුළත් කර නොමැත.
(ආ) උතුරු පළාතෙහි දත්ත ඇතුළත් කර නොමැත.
(ඇ) පතල් හා කැණීම්, විදුලිය, ගෑස් සහ ජලය යන උප අංශ ඉදිකිරීම් යටතේ වර්ගීකරණය කර ඇත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව නිර්වචනය කර ඇති පරිදි සමීක්ෂණය සිදු කළ කාලච්ඡේදය තුළ වැටුපක්, ලාභයක් හෝ පවුලට යම් ප්‍රතිලාභයක් (ගෙවීමක් නොලබන) ලබා ගැනීම සඳහා යම් කාර්යයක නියුක්තව සිටි පුද්ගලයෙක් සේවානියුක්තිකයකු ලෙස සැලකේ. සේවා තත්ත්වය අනුව සලකා බැලීමේ දී කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය පවත්වන ලද කාලච්ඡේදය තුළ, යම් ගෙවීමක් ලබන සේවකයන්, සේවායෝජකයන්, ස්වයං රැකියාවල නියුතු අය හෝ ගෙවීමක් නොලබන පවුලේ සේවකයන්, සේවානියුක්තිකයන් ලෙස ගණන් ගැනේ. සමීක්ෂණය පැවති කාලයේ දී වැඩක නොයෙදුණ ද රැකියාවක් ඇති පුද්ගලයන් සේවානියුක්තිකයන් ලෙස පිළිගැනේ. අසනීප වීම, අයහපත් කාලගුණ තත්ත්වය හෝ කාර්මික ආරවුල් හේතු කොට ගෙන තාවකාලිකව සේවයට වාර්තා නොකළ ද, එම පුද්ගලයන් ද සේවා නියුක්තිකයන් ලෙස සැලකේ.

**4.10 සංඛ්‍යා සටහන**

**සේවා නියුක්ති මූලයන්**

ප්‍රතිශතය

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයින් | පෞද්ගලික අංශයේ සේවකයින් | සේව්‍යයන් | ස්වයං රැකියාවන්හි නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2007 (අ) | 13.8 | 42.7 | 2.8 | 30.4 | 10.3 | 100.0 |
| 2008 (අ) | 14.9 | 41.1 | 3.0 | 30.3 | 10.8 | 100.0 |
| 2008 (ආ) | 15.2 | 41.2 | 2.9 | 30.3 | 10.5 | 100.0 |
| **2009 (වාර්ෂික) (අ)** | **15.2** | **42.1** | **2.7** | **29.0** | **11.0** | **100.0** |
| පළමු කාර්තුව | 15.5 | 41.4 | 2.7 | 28.4 | 12.1 | 100.0 |
| දෙවන කාර්තුව | 15.1 | 43.0 | 2.9 | 28.6 | 10.5 | 100.0 |
| තෙවන කාර්තුව | 15.7 | 42.5 | 2.9 | 28.1 | 10.7 | 100.0 |
| සිව්වන කාර්තුව | 14.5 | 41.6 | 2.3 | 31.0 | 10.6 | 100.0 |
| **2009 (වාර්ෂික) (ආ)** | **15.5** | **42.1** | **2.6** | **29.2** | **10.6** | **100.0** |
| පළමු කාර්තුව | 16.0 | 41.1 | 2.6 | 28.7 | 11.6 | 100.0 |
| දෙවන කාර්තුව | 15.2 | 43.1 | 2.9 | 28.8 | 10.1 | 100.0 |
| තෙවන කාර්තුව | 16.0 | 42.8 | 2.8 | 28.1 | 10.4 | 100.0 |
| සිව්වන කාර්තුව | 14.8 | 41.4 | 2.3 | 31.1 | 10.4 | 100.0 |

(අ) උතුරු හා නැගෙනහිර පළාත් දෙකෙහි දත්ත ඇතුලත් කර නොමැත.
(ආ) උතුරු පලාතෙහි දත්ත ඇතුලත් කර නොමැත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වී ඇත. ඒ අනුව, සේවා අංශයේ දායකත්වය පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සියයට 41.2 සිට 2009 දී සියයට 42.3 දක්වා වැඩි විය. මෙම කාලය තුළ දී මුළු ආර්ථික වර්ධනය කෙරෙහි ඉහළම දායකත්වයක් සැපයූ සේවා අංශය මෙම වැඩි වීම තවදුරටත් ඉහළ නංවන ලදී. සේවා අංශයේ සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාවෙහි වැඩි වීම ප්‍රධාන වශයෙන් පුද්ගල සේවා, වෙළෙඳ හා හෝටල් සේවා යන කාණ්ඩවල පෙන්නුම් කෙරිණි. මේ අතර, කෘෂිකර්මාන්ත අංශයේ සේවා නියුක්ති දායකත්වය සියයට 32.6ක් ලෙස 2009 වර්ෂය තුළ දී නොවෙනස්ව පැවැතිණි. කෙසේ වෙතත්, කර්මාන්ත අංශයේ සේවා නියුක්ති දායකත්වය සියයට 26.2 සිට සියයට 25.1 දක්වා වර්ෂය තුළ දී පහත වැටී ඇත. නිෂ්පාදන හා ඉදිකිරීම් අංශවල සේවා නියුක්තිය අඩු මට්ටමක පැවැතීම නිසා මුළු සේවා නියුක්තියට කර්මාන්ත අංශයෙන් ලැබුණු සේවා නියුක්ති දායකත්වය පහත වැටිණි.

**4.11 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| අංශය | 2007 | 2008 | 2009(අ) | ප්‍රතිශත වෙනස 2008/2007 | ප්‍රතිශත වෙනස 2009/2008(අ) |
|---|---|---|---|---|---|
| රාජ්‍ය (ආ) | 937,494 | 990,410 | 1,047,041 | 5.6 | 5.7 |
| අර්ධ රාජ්‍ය (ඇ) | 259,116 | 261,318 | 266,543 | 0.8 | 2.0 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,196,610** | **1,251,728** | **1,313,584** | **4.6** | **4.9** |

(අ) තාවකාලික
(ආ) මධ්‍යම රජය, පළාත් සභා හා ප්‍රාදේශීය සභා
(ඇ) රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රැකියා නියුක්තියේ ස්වභාවය අනුව වර්ග කළ විට, 2008 වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්, පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් සහ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් යන කාණ්ඩවල දායකත්වයේ වැඩි වීමක් පෙන්නුම් කළ අතර, සේවා යෝජකයන් හා ස්වයං රැකියාවල නියුතු සේවකයන් යන කාණ්ඩවලින් ලැබුණු දායකත්වයේ අඩු වීමක් පෙන්නුම් කෙරිණි.** මුළු සේවා නියුක්තියෙන් සියයට 15.5ක් වන රාජ්‍ය අංශය හා සසඳන විට සේවා නියුක්තියට සියයට 42.1ක විශාල දායකත්වයක් ලබා දෙන පෞද්ගලික අංශය 2009 දී ද රැකියා අවස්ථා උත්පාදනය කරමින් තවදුරටත් එහි ප්‍රමුඛත්වය පවත්වාගෙන යන ලදී.

## සේවා වියුක්තිය

**පසුගිය වසර කිහිපය තුළ පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ සේවා වියුක්තිය, 2009 පළමු කාර්තුවේ සිට ආපසු හැරීමක් පෙන්නුම් කළේය.** මෙය ප්‍රධාන වශයෙන්, ගෝලීය ආර්ථික අවපාතයට අනුරූපව ආර්ථික ක්‍රියාකාරකම් අඩු වීම හේතු කොට ගෙන සිදු විය. කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, 2008 දී සියයට 5.4ක් වූ සේවා වියුක්ති අනුපාතය 2009 දී සියයට 5.8 දක්වා ඉහළ නැගිණි. 2009 වර්ෂයේ දී සේවා වියුක්තිකයන්ගේ සංඛ්‍යාව 471,000ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය පෙර වර්ෂයේ වූ 434,000ට වඩා වැඩි වීමකි. මෙම කාලපරිච්ඡේද

**4.12 සංඛ්‍යා සටහන** **සේවා වියුක්ති අනුපාතය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| ශීර්ෂය | 2007 (අ) | 2008 (අ) | 2008 (ආ) | 2009 (අ) පළමු කාර්තුව | 2009 (අ) දෙවන කාර්තුව | 2009 (අ) තෙවන කාර්තුව | 2009 (අ) සිව්වන කාර්තුව | 2009 (අ) වාර්ෂික | 2009 (ආ) පළමු කාර්තුව | 2009 (ආ) දෙවන කාර්තුව | 2009 (ආ) තෙවන කාර්තුව | 2009 (ආ) සිව්වන කාර්තුව | 2009 (ආ) වාර්ෂික |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමස්ත | 6.0 | 5.2 | 5.4 | 5.3 | 6.3 | 5.8 | 5.4 | 5.7 | 5.5 | 6.2 | 5.9 | 5.7 | 5.8 |
| ස්ත්‍රී පුරුෂ අනුව | | | | | | | | | | | | | |
| පුරුෂ | 4.3 | 3.6 | 3.7 | 4.1 | 4.7 | 4.4 | 3.9 | 4.3 | 4.2 | 4.6 | 4.4 | 4.0 | 4.3 |
| ස්ත්‍රී | 9.0 | 8.0 | 8.4 | 7.5 | 9.1 | 8.1 | 8.1 | 8.2 | 7.9 | 9.2 | 8.6 | 8.7 | 8.6 |
| වයස් කාණ්ඩ අනුව (අවුරුදු) | | | | | | | | | | | | | |
| 15-19 | 21.6 | 20.6 | 20.8 | 17.8 | 26.6 | 20.4 | 20.3 | 21.2 | 18.3 | 25.0 | 20.6 | 19.7 | 20.9 |
| 20-29 | 15.0 | 13.2 | 13.7 | 14.8 | 15.5 | 15.3 | 14.7 | 15.1 | 15.2 | 15.2 | 15.5 | 15.7 | 15.4 |
| 30-39 | 3.3 | 3.1 | 3.1 | 3.5 | 4.1 | 3.9 | 3.1 | 3.6 | 3.3 | 4.3 | 3.9 | 3.3 | 3.7 |
| 40 සහ ඊට ඉහළ | 1.3 | 1.2 | 1.2 | 1.1 | 1.7 | 1.4 | 1.3 | 1.4 | 1.2 | 1.6 | 1.4 | 1.3 | 1.4 |
| අධ්‍යාපන මට්ටම අනුව | | | | | | | | | | | | | |
| 4 ශ්‍රේණිය/5 වසර සහ ඊට පහළ | 1.3 | 1.1 | - | - | - | - | - | - | - | - | - | - | - |
| 5-9 ශ්‍රේණිය/6-10 වසර | 5.2 | 4.5 | 4.5 | 4.3 | 5.7 | 5.2 | 4.4 | 4.9 | 4.4 | 5.7 | 5.3 | 4.5 | 5.0 |
| අ.පො.ස. (සා.පෙ)/ජා.පො.අ.ස | 8.2 | 7.4 | 7.8 | 8.9 | 8.6 | 8.5 | 6.5 | 8.1 | 9.3 | 8.6 | 9.1 | 6.9 | 8.5 |
| අ.පො.ස. (උ.පෙ)/උ.ජා.අ.ස සහ ඊට ඉහළ | 11.8 | 9.9 | 10.5 | 10.1 | 10.4 | 10.3 | 12.5 | 10.8 | 10.6 | 10.4 | 10.2 | 13.4 | 11.2 |


(අ) උතුරු හා නැගෙනහිර පලාත් දෙකෙහි දත්ත ඇතුළත් කර නොමැත.
(ආ) උතුරු පලාතෙහි දත්ත ඇතුළත් කර නොමැත.

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දෙක අතර, උතුරු හා නැගෙනහිර පළාත් දෙකම හැර සේවා වියුක්ති අනුපාතය සියයට 5.2 සිට සියයට 5.7 දක්වා වැඩි වීමක් පෙන්නුම් කෙරිණි. එසේ වුව ද, දේශීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම, උතුරු හා නැගෙනහිර පළාත්වල ඇරඹීමට සැලසුම් කරන ලද හා දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබන සංවර්ධන ව්‍යාපෘති, ප්‍රතිසංස්කරණ කටයුතු, නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපන වැඩසටහන් මෙන්ම ගෝලීය ආර්ථික අවපාතයෙන් මිදී ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් 2010 දී වැඩි රැකියා අවස්ථා උත්පාදනය කරනු ඇත. සත්‍ය වශයෙන්ම, ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ ගමන් මග ආරම්භ කර ඇති බව දක්වමින්, අවසන් කාර්තු දෙකෙහි දී සේවා වියුක්තිය ක්‍රමිකව අඩු විය.

**නොකඩවා පවතින තරුණ සේවා වියුක්තිය, විශේෂයෙන්ම උගත් තරුණයන් අතර සේවා වියුක්තිය, අවධානය යොමු කළ යුතු කරුණක් බවට පත් වී තිබේ.** මෙම තත්ත්වය උගත් තරුණ පුරුෂ පක්ෂයට වඩා උගත් තරුණ කාන්තා පක්ෂය අතර වඩාත් තියුණු මුහුණුවරක් ගෙන ඇත. අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්තිය සලකා බැලීමේ දී සියයට 11.2ක වැඩිම සේවා වියුක්ති අනුපාතය වාර්තා වන්නේ අ.පො.ස (උ.පෙළ) සහ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන් අතරෙහි වන අතර, අ.පො.ස (සා.පෙළ) සුදුසුකම් සහිත අයගේ සේවා වියුක්ති අනුපාතය සියයට 8.5කි. ශ්‍රම වෙළඳපොළේ පවතින රැකියා අවස්ථාවන් හා සේවා වියුක්තිකයන්ගේ අපේක්ෂාවන් අතර නොකඩවා පවතින නොගැලපීම මෙම ගැටළුවට ප්‍රධාන හේතුවක් විය හැකිය.

**4.2 රූප සටහන** **ශ්‍රම බලකාය සහ විරැකියාවේ ප්‍රවණතාවයන් 2005-2009**




**පසුගිය වසර කිහිපයේ දී නිරීක්ෂණය වූ පරිදි අවුරුදු 15-24 වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතය ඉතා තීව්‍ර විය.** කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයේ ඇස්තමේන්තුවලට අනුව, මෙම වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතය 2008 වූ සියයට 18.8 සිට 2009 දී සියයට 21.3 දක්වා වැඩි විය. සියයට 27.9ක් වූ තරුණ කාන්තා පක්ෂය අතර සේවා වියුක්ති අනුපාතය හා සැසඳීමේ දී තරුණ පිරිමි පක්ෂය අතර වූ සේවා වියුක්තිය සියයට 17.1ක් විය.

### විදේශ සේවා නියුක්තිය

**විදේශ රැකියා අවස්ථා 2009 වර්ෂයේ දී තවදුරටත් ප්‍රධාන සේවා නියුක්ති මූලයක් ලෙස වැදගත් විය.** විදේශ විනිමය ඉපැයීම් කෙරෙහිත්, රට තුළ විරැකියා පීඩනය අඩු කිරීම කෙරෙහිත් සැලකිය යුතු ලෙස දායක වෙමින් විදේශ සේවා නියුක්තියේ

අඛණ්ඩ වැඩි වීමක් පසුගිය වසරවල පෙන්නුම් කරන ලදී. කෙසේ නමුත්, 2009 පළමු කාර්තුවේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාවෙහි සුළු පහත වැටීමක් පෙන්නුම් කළ ද මෙම තාවකාලික පසුබෑස්ම දෙවැනි කාර්තුවේ දී යථා තත්ත්වයට පත්වන ලදී. මෙම පහත වැටීම ගෝලීය ආර්ථික අවපාතයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රමිකයන් සඳහා විදේශවලින් ලැබුණු ඉල්ලුම අඩු වීම නිසා සිදු විය. මෙම වර්ෂය තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සංඛ්‍යාව 247,119ක් වූ අතර, එය පසුගිය වසරේ දී 250,499 ක් විය. විදේශ රැකියා නියුක්තිකයන්ගේ මෙම අඩු වීම වෘත්තිකයන්, මධ්‍යම මට්ටම, ලිපිකරු හා ඒ ආශ්‍රිත රැකියා සහ නුපුහුණු සේවක යන සියලුම මිනිස් බල කාණ්ඩයන්හි දක්නට ලැබිණි.

**ශ්‍රී ලාංකික සංක්‍රමිකයන්ට වැඩි සමාජ ප්‍රතිලාභ සහිත වඩා හොඳ සේවා තත්ත්වයක් සහ වැඩි විදේශ රැකියා අවස්ථා ප්‍රමාණයක් ඇති කිරීම සඳහා 2009 වර්ෂය තුළ දී අදාළ බලධාරීන් විසින් වඩා ක්‍රියාකාරී වූ ඵලදායී පියවර කිහිපයක්ම ගන්නා ලදී.** මේ යටතේ රැකියා සඳහා බඳවා ගැනීමේ නියෝජිතයන් ඇතුළු විවිධ පාර්ශ්වයන්ගෙන් සංක්‍රමික සේවකයන්ට සිදු වන විවිධ සූරාකෑම් මගහැරවීම සහ විදේශ රැකියා කර්මාන්තයේ සිදු වන විවිධ නීති විරෝධී ක්‍රියාවන් මැඩලීමේ අරමුණෙන් 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ (ශ්‍රී.ලං.වි.සේ.නි.කා.) පනත සංශෝධනය කිරීම ද ඇතුළත් වේ. ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය විසින් 2009 වර්ෂයේ දී සිදු කරන ලද තවත් වැදගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් වන්නේ බදුල්ල, අනුරාධපුර සහ මහනුවර යන නගරවල පළාත් කාර්යාල විවෘත කිරීම තුළින් ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශයේ සේවාවන් විමධ්‍යගත කිරීමයි. එමෙන්ම, 'නැගෙනහිර නවෝදය වැඩසටහන' යටතේ ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන නගරවල ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශයේ දිස්ත්‍රික් මධ්‍යස්ථාන පිහිටුවන ලදී. තව ද, සංක්‍රමික සේවකයන්ගේ සේවා තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒමේ අරමුණෙන්, විශේෂයෙන්ම නුපුහුණු කාණ්ඩවල සේවකයන්ගේ අවම වැටුප් නියම කරන ලදී. මේ අතර, වැඩ කරන ස්ථානවලින් වාර්තා වන අනිසි ක්‍රියා වැළැක්වීම සඳහා අදාළ රටවල පිහිටි තානාපති කාර්යාල මගින් කරනු ලබන නිරීක්ෂණයන් දැඩි කරන ලදී. සංක්‍රමික සේවකයන් සහ විදේශ රැකියා අපේක්ෂාවෙන් සිටින අය ඇතුළු පාර්ශ්වකරුවන්ට පහසුකම් සැලසීම සඳහා විස්තරාත්මක දත්ත පදනමක් සංවිධානය කිරීම ද වර්ෂය තුළ දී ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය විසින් ආරම්භ කරන ලද තවත් වැදගත් කාර්යයකි. මෙම පියවරයන් ඇතුළුව 2010 වර්ෂය තුළ දී සංක්‍රමික සේවකයන් සඳහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන සුබසාධක හා ප්‍රවර්ධන වැඩසටහන් සහ දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත්වල ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශ සේවාවන් වැඩි දියුණු කිරීම තුළින් ඉදිරි වර්ෂයේ දී විදේශ රැකියා සඳහා සාධනීය බලපෑමක් ඇති වනු ඇත.

**4.13 සංඛ්‍යා සටහන** **විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**

| විදේශ සේවා නියුක්තිය | 2007 | | 2008 | | 2009 (අ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| මුළු විදේශ රැකියා සංඛ්‍යාව | 218,459 | 100.0 | 250,499 | 100.0 | 247,119 | 100.0 |
| මූලයන් අනුව | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයින් | 146,515 | 67.1 | 160,973 | 64.3 | 156,720 | 63.4 |
| වෙනත් | 71,944 | 32.9 | 89,526 | 35.7 | 90,399 | 36.6 |
| ස්ත්‍රී/පුරුෂ අනුව | | | | | | |
| පුරුෂ | 103,482 | 47.4 | 128,232 | 51.1 | 119,276 | 48.3 |
| ස්ත්‍රී | 114,977 | 52.6 | 122,267 | 48.9 | 127,843 | 51.7 |
| ශ්‍රම කාණ්ඩ අනුව | | | | | | |
| වෘත්තීය | 1,653 | 0.8 | 2,835 | 1.1 | 2,820 | 1.1 |
| මධ්‍යම | 3,962 | 1.8 | 8,727 | 3.5 | 6,392 | 2.6 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත | 4,551 | 2.1 | 6,791 | 2.7 | 6,706 | 2.7 |
| පුහුණු ශ්‍රමික | 50,263 | 23.0 | 59,718 | 23.8 | 61,230 | 24.8 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 3,499 | 1.6 | 5,326 | 2.1 | 6,036 | 2.4 |
| නුපුහුණු ශ්‍රමික | 52,176 | 23.9 | 59,239 | 23.6 | 50,158 | 20.3 |
| ගෘහ සේවිකා | 102,355 | 46.9 | 107,923 | 43.1 | 113,777 | 46.0 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**4.14 සංඛ්‍යා සටහන** **ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණ**

| රට | 2008 | | 2009(අ) | | වෙනස(අ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය (%) | සංඛ්‍යාව | දායකත්වය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| කටාර් | 39,476 | 15.7 | 43,744 | 17.7 | 4,268 | 10.8 |
| සෞදි අරාබියාව | 67,441 | 26.9 | 77,826 | 31.5 | 10,385 | 15.4 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 51,097 | 20.5 | 39,586 | 16.0 | -11,511 | -22.5 |
| කුවේට් | 46,941 | 18.7 | 42,400 | 17.2 | -4,541 | -9.7 |
| වෙනත් | 45,544 | 18.2 | 43,563 | 17.6 | -1,981 | -4.3 |
| **එකතුව** | **250,499** | **100.0** | **247,119** | **100.0** | **-3,380** | **-1.3** |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**විදේශ රැකියා නියුක්තිය රට තුළට විදේශ මුදල් ගලා එන ඉතා වැදගත් හා ස්ථාවර මූලයක් ලෙසින් තවදුරටත් පැවැතිණි.** ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශයට අනුව, ශ්‍රී ලංකාවේ සංක්‍රමණික ජනගහනය මිලියන 1.8ක් පමණ විය. මෙම මුළු විදේශ සේවා නියුක්තියට සියයට 70ක ප්‍රධාන දායකත්වයක් සපයමින් කාන්තා සංක්‍රමික ශ්‍රමිකයන් ප්‍රමුඛත්වය දැරීය. පසුගිය වසර කිහිපය මුළුල්ලේ වැඩි වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ පුරුෂ පක්ෂයේ වාර්ෂික විදේශ ගත වීම 2009 වර්ෂයේ දී අඩු වීමක් පෙන්නුම් කළ අතර, එය 2008 පැවැති සියයට 51 සිට සියයට 48 දක්වා අඩු විය. ඒ අනුව, වාර්ෂික විදේශ ගත වීමේ පුරුෂ සහ ස්ත්‍රී සංයුතිය 2008 පැවැති 51:49 අනුපාතය සමඟ සැසඳීමේ දී 2009 වර්ෂයේ දී 48:52ක් ලෙස වාර්තා විය. ගෘහ සේවිකාවන් සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව 2008 පැවැති 107,923 සිට 2009 වර්ෂයේ දී 113,777 දක්වා සියයට 5.4කින් වැඩි විය. තව ද, මැදපෙරදිග කලාපයෙන් පරිබාහිර සම්ප්‍රදායික නොවන රටවල වෙළඳපොළවල් තුළින් විදේශ රැකියා වැඩිකර ගැනීමේ අරමුණෙන් ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය විසින් නව රැකියා අවස්ථා සොයා බැලීම තවදුරටත් කරගෙන යන ලදී. විදේශ සංක්‍රාම වශයෙන් 2009 වර්ෂය තුළ දී එ.ජ.ඩොලර් මිලියන 3,330ක් ලැබුණු අතර, එය පසුගිය වසර තුළ දී ලැබුණු එ.ජ.ඩොලර් මිලියන 2,918 සමඟ සසඳන විට සියයට 14.1ක වර්ධනයකි. දශක ගණනාවක් පැවැති ගැටුම්කාරී තත්ත්වය අවසන් වීමත්, සම්ප්‍රදායික නොවන ශ්‍රම වෙළඳපොළවල නව විදේශ රැකියා අවස්ථා සොයා බැලීමත් අදාළ ක්‍රම වේදයන් මනාව සැකසීමට නොකඩවා ගන්නා ලද උත්සාහයන් සහ විදේශ රැකියා සඳහා අයදුම් කරන්නන් විදේශීය ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සූදානම් කිරීමත් හේතුවෙන් විදේශ රැකියා සඳහා ඇති අවස්ථාවන් තවදුරටත් වර්ධනය වීමට හා රටට ලැබෙන විදේශ සංක්‍රාම වැඩි වීමට හේතු වනු ඇත.

**මුළු සංක්‍රමණික ශ්‍රම බලකායෙන් සියයට 90 කට වැඩි ප්‍රමාණයකට නොකඩවාම දායකත්වය ලබා දෙමින්, මැදපෙරදිග කලාපය ශ්‍රම වෙළඳපොළේ අනෙකුත් කලාප අභිබවා සිටින අතර, එම සංක්‍රමණික ශ්‍රම බලකායෙන් වැඩි පිරිස ගෘහ සේවිකාවන්ගෙන් සමන්විත වේ.** 2009 වර්ෂයේ විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ මුළු සංඛ්‍යාවෙන් සියයට 82.4ක් ම පිටත්ව ගොස් ඇත්තේ මැදපෙරදිග කලාපයේ පිහිටි සෞදි අරාබිය, දොහා කටාර්, කුවේටය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවලටය. මෙම රටවල් අතුරින්, විදේශ රැකියා සඳහා මුළු පිටත්ව යෑම් සංඛ්‍යාවෙන් සියයට 49.2කට දායක වූ සෞදි අරාබිය සහ දොහා කටාර් යන රටවල් දෙකට පිටත්ව ගිය ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව, පිළිවෙළින් සියයට 15.4කින් සහ සියයට 10.8කින් වර්ධනය වී ඇත. මේ අතර, 2008 වර්ෂය හා සැසඳීමේ දී කුවේටය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයට පිටත්ව ගිය ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව, 2009 වර්ෂයේ දී පිළිවෙළින් සියයට 9.7කින් සහ සියයට 22.5කින් පහත වැටී ඇත. විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රමිකයන්ගෙන් ගෘහ සේවිකාවන් දරන පංගුව පසුගිය වසරේ පැවති සියයට 43 හා සසඳන විට 2009 වර්ෂයේ දී සියයට 46 දක්වා වැඩි වී ඇත. ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය විසින් කුවේටය, ඕමානය, ජෝර්දානය සහ ලෙබනනය වැනි ශ්‍රමිකයන් ලබා ගන්නා රටවල් සමඟ සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සුභසාධනය සහ සේවා ස්ථානවල ආරක්ෂාව වැනි කරුණු පිළිබඳව අවබෝධතා ගිවිසුම්වලට ඇතුළත් වීමට ගනු ලබන ක්‍රියාමාර්ග විදේශ රැකියා නියුක්තිය වඩා ආකර්ෂණීය කිරීමට හේතු වනු ඇත. විදේශ රැකියා නියුක්තිකයන්ගෙන් රටට ලැබෙන ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන, සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සෞඛ්‍ය හා වෘත්තීයමය ආරක්ෂාව වැනි කරුණු සම්බන්ධයෙන් ඇති ගැටළු විසඳීම සඳහා තවදුරටත් සොයා බැලිය යුතු අතර, විදේශ සේවා නියුක්තිය තුළින් මතුවන ඔවුන්ගේ සමාජයීය ගැටළු සම්බන්ධයෙන් ද ක්‍රියා කළ යුතුව ඇත.

### ශ්‍රම ඵලදායිතාවය

**සමස්ත ශ්‍රම ඵලදායිතාවය, පසුගිය වර්ෂ කිහිපය තුළ පැවැති ඉහළ යෑමේ ප්‍රවණතාවය අනුව යමින් 2009 වර්ෂයේ දී ද තවදුරටත් වැඩි විය.** එක් ශ්‍රමිකයකු සඳහා වන දළ දේශීය නිෂ්පාදිතය (2002 වර්ෂයේ ස්ථාවර මිල ගණන් මත පදනම් වූ) අනුව මනිනු ලබන

**4.15 සංඛ්‍යා සටහන — ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව**

| ශීර්ෂය | 2007 | 2008 | 2009(අ) |
|---|---|---|---|
| ස්ථාවර (2002) මිල අනුව | | | |
| ද.දේ.නි. (රු. මිලියන) | 2,232,656 | 2,365,501 | 2,449,304 |
| කෘෂිකාර්මික | 265,870 | 285,897 | 294,921 |
| කර්මාන්ත | 635,199 | 672,791 | 701,129 |
| සේවා | 1,331,587 | 1,406,813 | 1,453,254 |
| ශ්‍රම ඵලදායීතාව එක් | | | |
| පුද්ගලයකු සඳහා රු. '000 | 317.0(ආ) | 309.3 (ඇ) | 322.2(ඇ) |
| කෘෂිකාර්මික | 120.7(ආ) | 114.8(ඇ) | 119.1(ඇ) |
| කර්මාන්ත | 339.0(ආ) | 335.6(ඇ) | 367.0(ඇ) |
| සේවා | 449.0(ආ) | 446.1(ඇ) | 451.8(ඇ) |

(අ) තාවකාලික
(ආ) උතුරු හා නැගෙනහිර පළාත් දෙකෙහි දත්ත ඇතුලත් කර නොමැත.
(ඇ) උතුරු පළාතෙහි දත්ත ඇතුලත් කර නොමැත.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රම ඵලදායිතාවය, 2008 වර්ෂයට වඩා සියයට 4.2කින් වැඩි වෙමින් 2009 වර්ෂයේ දී එක් ශ්‍රමිකයකුගේ ශ්‍රම ඵලදායිතාවය රුපියල් 322,200ක් දක්වා වැඩි විය. කාර්මික (සියයට 9.4) සහ කෘෂිකාර්මික (සියයට 3.7) අංශයන්හි ඵලදායිතාවය ඉහළ යෑම 2009 වර්ෂයේ සමස්ත ඵලදායිතාවය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් දායක වූ අතර සේවා අංශයේ ඵලදායිතාවය මෙම වර්ෂයේ දී සියයට 1.3ක ආන්තික වර්ධනයක් වාර්තා කළේය. කෘෂිකාර්මික අංශය විශාල වශයෙන් යාන්ත්‍රීකරණය වීම එම අංශයේ ඵලදායිතාවය වැඩි වීමට හේතු වූවා විය හැකිය. ව්‍යාප්ති සේවා වැඩි කිරීම සහ වැඩි දියුණු කළ බීජ, තාක්ෂණය හා යාන්ත්‍රීකරණය යොදා ගැනීම තුළින් කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය වර්ධනය කිරීමට තවදුරටත් අවකාශ ඇත. කෘෂි අංශය පදනම් කරගත් අගය වැඩි කිරීමේ සැකසුම් කර්මාන්ත ශක්තිමත් කිරීම තුළින් ආහාර භෝග තිරසාර පදනමකින් වගා කිරීම වැඩි දියුණු කළ හැකිය. ශ්‍රම ඵලදායිතාවයේ නොකඩවා සිදු වන වැඩි වීම දිරි ගන්වනසුළු හා ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට හේතු වන අතර, මෙය ආර්ථිකයේ ඇති වන උද්ධමන පීඩනය පාලනය කිරීමට ද උපකාරී වේ.

### කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ

පසුගිය වර්ෂයේ පෞද්ගලික අංශයේ පැවැති 51ක් වූ වැඩ වර්ජන සංඛ්‍යාවට සාපේක්ෂව 2009 වර්ෂයේ දී පැවැති වැඩ වර්ජන සංඛ්‍යාව 8 දක්වා කැපී පෙනෙන ලෙස අඩු විය. එමෙන්ම, 2008 දී අහිමි වූ මිනිස් පැය ගණන වන 65,655 හා සැසඳීමේ දී 2009 වර්ෂයේ එම පැය ගණන 7,665 දක්වා විශාල ලෙස අඩු විය. 2008 වර්ෂයේ දී වැවිලි කර්මාන්ත අංශයේ වැඩ වර්ජන 34ක් පැවැති අතර, 2009 දී එය 2 දක්වා අඩු විය. සේවා යෝජකයන්, සේවකයන් සහ වෘත්තීය සමිති අතර යහපත් කාර්මික සාමයක් පැවැති බැවින් වර්ජන නිසා අහිමි වූ මිනිස් පැය ගණන ද ඒ සඳහා සහභාගි වූ ශ්‍රමිකයන් සංඛ්‍යාව ද කැපී පෙනෙන ලෙස පහළ

**4.16 සංඛ්‍යා සටහන — පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ(අ) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| 2006 | 19 | 196,520 | 4,821,394 | 34 | 13,283 | 72,513 | 53 | 209,803 | 4,893,907 |
| 2007 | 8 | 1,468 | 6,089 | 17 | 6,079 | 36,109 | 25 | 7,547 | 42,198 |
| 2008 | 34 | 34,014 | 41,525 | 17 | 3,917 | 24,130 | 51 | 37,931 | 65,655 |
| පළමු කාර්තුව | - | - | - | 6 | 1,649 | 12,359 | 6 | 1,649 | 12,359 |
| දෙවන කාර්තුව | 4 | 491 | 1,037 | 4 | 754 | 1,254 | 8 | 1,245 | 2,291 |
| තෙවන කාර්තුව | 22 | 31,648 | 33,609 | 4 | 870 | 955 | 26 | 32,518 | 34,564 |
| සිව්වන කාර්තුව | 8 | 1,875 | 6,879 | 3 | 644 | 9,562 | 11 | 2,519 | 16,441 |
| **2009 (ආ)** | **2** | **300** | **300** | **6** | **4,720** | **7,365** | **8** | **5,020** | **7,665** |
| පළමු කාර්තුව | 2 | 300 | 300 | 3 | 3,095 | 6,190 | 5 | 3,395 | 6,490 |
| දෙවන කාර්තුව | - | - | - | 3 | 1,625 | 1,175 | 3 | 1,625 | 1,175 |
| තෙවන කාර්තුව | - | - | - | - | - | - | - | - | - |
| සිව්වන කාර්තුව | - | - | - | - | - | - | - | - | - |

(අ) අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන ඇතුළත්ය
(ආ) තාවකාලික

මූලය : කම්කරු දෙපාර්තමේන්තුව

වැටිණි. පෞද්ගලික අංශයේ අනෙකුත් අංශවල පසුගිය වර්ෂයේ 17ක් වූ වැඩ වර්ජන සංඛ්‍යාව 2009 දී 6 දක්වා අඩු විය. මෙම වැඩ වර්ජනවලට සහභාගි වූ ශ්‍රමිකයන් ගණන පෙර වර්ෂයේ වූ 3,917 සිට 2009 වර්ෂයේ දී 4,720 දක්වා වැඩි වුව ද, අහිමි වූ මිනිස් දින ගණන පසුගිය වර්ෂයේ පැවැති 24,130 හා සැසඳීමේ දී 2009 වර්ෂයේ දී 7,365ක් දක්වා සියයට 69කින් විශාල වශයෙන් අඩු විය. පාර්ශ්වයන් අතර මනා සම්බන්ධතාවන් පවත්වා ගැනීම, කළමනාකරණ ක්‍රියාදාමයන්ගේ ඇඩි විනිවිද භාවයක් තිබීම සහ කාර්මික සාමය වර්ධනය කිරීම සඳහා සේවා ස්ථානවල යහපත් සංවාදයක් පවත්වා ගෙන යෑම වැනි සාධකයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මෙම යහපත් වාතාවරණය ඇති විය. රටේ ආයෝජන වැඩි කර ගැනීමටත්, ඵලදායිතාවය වර්ධනය කර ගැනීමටත් මෙවැනි යහපත් වැඩ කිරීමේ වාතාවරණයක් නොකඩවා පවත්වා ගෙන යෑම අත්‍යවශ්‍ය වේ.